ISSN 2357-2973

# ජාතික පුස්තකාල විමර්ශන
# தேசிய நூலக நோக்கு
# NATIONAL LIBRARY REVIEW

වෙළුම 02, කලාපය 01/02 ජනවාරි - ජූනි /ජූලි - දෙසැම්බර් 2015

தொகுதி 02, இலக்கம் 01 / 02 ஜனவரி - ஜூன் / ஜூலை - டிசம்பர் 2015

Vol. 02, No 01/02 January - June / July - December 2015



ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை

National Library and Documentation Services Board

# ජාතික පුස්තකාල විමර්ශන

# தேசிய நூலக நோக்கு

# NATIONAL LIBRARY REVIEW

# ජාතික පුස්තකාල විමර්ශන

# தேசிய நூலக நோக்கு

# NATIONAL LIBRARY REVIEW

වෙළුම 02, කලාපය 01/02 ජනවාරි - ජූනි /ජූලි - දෙසැම්බර් 2015

தொகுதி 02, இலக்கம் 01 / 02 ஜனவரி - ஜூன் / ஜூலை - டிசம்பர் 2015

Vol. 02, No 01/02 January – June / July – December 2015

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை

National Library and Documentation Services Board

# NATIONAL LIBRARY REVIEW

Vol. 02, No : 01/02 January –June / July - December 2015

ISSN 2357 – 2973

## Advisory Committee

Dr. W.A. Abeysinghe
Prof. Piyadasa Ranasingha
Dr. Premila Gamage
Dushyanthi Daniel

## Editors

W. Sunil
G. D. Amarasiri

## Assistant Editors

Priyanga Bandara
Kamalangani Subasinghe

## Computer Type Setting

Asoka Damayanthi

## Publisher

Library Research Division
National Library and Documentation Services Board
No. 14, Independence Avenue
Colombo 07.
SRI LANKA

Telephone : 011- 3056388
Fax : 011- 2685201
E- mail : research@mail.natlib.lk
Web site : www.natlib.lk

*Authors are responsible for the content of their articles published in this journal*

# Editors Note

Modern Society is introduced as an information society or knowledge based society. Information receives a very important place in national development. There fore, the generation of new knowledge required for the national development is a responsibility of the professionals as well as professional associations in library and information field. Information has become a part and parcel of every aspect of human life in modern society. Therefore, proper management of information is very important for the development of the country.

Researchers in the library and information field should have the opportunities to publish their research findings. Student population in library and information field is also increasing rapidly. They also should have facilities to obtain the required information for their academic purposes. This journal contributes into considerable extend to achieve the above objectives. This journal cover not only the articles in library and information field, but also the articles on other related fields.

We are extremely thankful to all the authors who provided articles for this journal and the members of the advisory committea of the National Library Review for their assistance. We also thank all the reviewers of the articles of this journal.

# Contents


**ශ්‍රී ලංකාවේ පුස්තකාල වෘත්තික හා වෘත්තීය සංවිධාන ආරම්භය, විකාශය හා ක්‍රියාකාරිත්වය පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්** 01-22

ආර්. ඩී. ආනන්ද තිස්ස

A Bibliometric Study of Postgraduate Theses Presented to the Institute of Indigenous Medicine, University of Colombo - During the Time Period 1995 – 2010 23-39

C. K. Gamage

**මහජන පුස්තකාල සේවාවේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ දී මානව සම්පත් කළමනාකරණයේ බලපෑම පිළිබඳ අධ්‍යයනයක් (උතුරු මැද පළාතේ මහජන පුස්තකාල ඇසුරෙන්)** 40-53

උදිත අලහකෝන් සහ ඩබ්ලිව්. එම්. අරවින්ද

Barriers for Research as Perceived by Science and Technology Academia in an Indian University 54-71

Dr. Mayak Trivedi & Jaydeep Mehta

**ස්වර්ණ පුස්තක සම්මාන ප්‍රදානය පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්** 72-91

මහේෂි අබේවික්‍රම

**அறிவுலக ஆய்வுச் செயற்பாடுகளில் தகவல்வளத் தரவுத்தளங்கள்: இலங்கை உயர்கல்வித் துறையை மையப்படுத்திய பார்வை** 92-110

துரையப்பா பிரதீபன்

Seeking Balance in Copyright Law for Persons with Sensory Disabilities 111-149

Denise Rosemary Nicholson

Guidelines for Contributors 150-151

# ශ්‍රී ලංකාවේ පුස්තකාලය වෘත්තික හා වෘත්තීය සංවිධාන ආරම්භය, විකාසය හා ක්‍රියාකාරිත්වය පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්

**ආර්.ඩී. ආනන්ද තිස්ස**

---

**සාරාංශය**

*19 වන සියවස අග භාගය වන විට මිනිසුන්ගේ ජීවන රටා ඉමහත් වේගයකින් වෙනස්වීමේ ප්‍රවණතාවක් පෙරපර දෙදිග සමාජ රටා තුළ නිර්මාණය විය. ධනේශ්වර අර්ථ ක්‍රමය, ඇති නැති පරතරය, සමාජ විපර්යාස, අධ්‍යාපන මට්ටම් හා වෘත්තීන්ගේ ස්වභාවය අනුව මෙකී තත්ත්වයන් වර්ධනය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්* **"එකා සැමටත් සැම එකාටත්"** *යන සමුපකාර ආදර්ශ පාඨය ක්‍රියාත්මක වීම අත්‍යවශ්‍ය සාධකයක් විය. පුස්තකාලය වෘත්තියේ විවිධ අභියෝග හමුවේ වඩාත් සංවිධානාත්මක ව මුහුණදීම සඳහා කණ්ඩායම් හැඟීම සහිත ව එක් අරමුණක් වෙනුවෙන් පෙනී සිටීම අත්‍යවශ්‍ය සමාජ අවශ්‍යතාවක් විය.*

*පුස්තකාලයාධිපතිත්වය වෘත්තියක් ලෙස වර්ධනය වීම නිසා එයට ආවේණික න්‍යායන් හා සංකල්ප බිහි වී ඇත. ශ්‍රී ලංකාවේ පුස්තකාලය වෘත්තිය නීතියෙන් ආවරණය වූ වෘත්තියක් වශයෙන් පුස්තකාලය ව්‍යවස්ථාවකින් ආවරණය වී නෛතික වශයෙන් පිළිගැනීමට ලක් වී ඇත. පුස්තකාලය සේවාවේ විවිධ තනතුරු සඳහා බඳවාගැනීමේ ක්‍රියාපටිපාටියක් අනුගමන කරනු ලැබේ. එහෙත් ආයතනික අවශ්‍යතාවන් අනුව සේවකයන් බඳවාගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කෙරේ.*

*කෙසේ වෙතත්, පුස්තකාලය යනු සමාජයේ ඉතාමත් කාර්ය බහුල මෙන් ම ඵලදායී සමාජ ආයතනයකි. පුස්තකාලය වර්ග අනුව හෝ පුස්තකාලය සේවාවට අදාළ වෘත්තීය හෝ වෘත්තීය නොවන සේවා හා ශ්‍රේණි අනුව විවිධ සංවිධාන බිහි වී ඇත. පුස්තකාලය සේවාවට අදාළ වන සංගම් හෝ සංවිධාන බිහිවීමට පාදක වන සාධකත්, ශ්‍රී ලංකාවේ පුස්තකාලය වෘත්තියට අදාළ වෘත්තික හා වෘත්තීය සංවිධාන පිළිබඳවත්, ඒවායේ ක්‍රියාකාරිත්වයත් සම්බන්ධයෙන් මෙම ලිපියෙන් අවධානය යොමු කෙරේ.*

**මූලික පද**

*පුස්තකාලය වෘත්තිය, වෘත්තික සංවිධාන, වෘත්තීය සංගම්, ජාතික හා ජාත්‍යන්තර සංවිධාන, පුස්තකාලය සංගම්, ශ්‍රී ලංකාවේ පුස්තකාලය සංවිධාන*

---

## 1. හැඳින්වීම

එක් මාර්ගයක ගමන් කළ වෘත්තිකයකුට එවැනි ම තවත් පුද්ගලයකුගේ සහයෝගය හා ආරක්‍ෂාව අවශ්‍ය බව තේරුම් ගෙන ඇත. එක් පුද්ගලයා දෙවැන්නෙකු හා සම්බන්ධ විය. ඒ දෙදෙනාට තවත් එවැන්නකුගේ සහයෝගය අවශ්‍ය බැවින් ක්‍රමයෙන් එක් එක් රැකියා කාණ්ඩවලට අයත් පිරිස් සමාජ කණ්ඩායම් වශයෙන් එක්වීමට තීරණය කළහ. ඒවා ක්‍රියාවට නැඟීම අනුව යහපත් ප්‍රතිඵල භුක්තිවිඳීමට ද එකී කණ්ඩායම්වලට හැකි වී තිබේ. කණ්ඩායමක් ගොඩ නැගෙන්නේ (අ). එක් එක් අයගේ හැකියාවන් දැනගැනීම (Forming) (ආ). විවිධ ගැටලු ඇතිවීම හා හැකියාවන් හඳුනා ගැනීම (Stroming) (ඇ). හැකියාවන් අනුව වගකීම් පැවරීම (Norming) හා (ඈ). ක්‍රියාවෙහි යෙදවීම හෝ අවශ්‍යතා ඉටුකිරීම හෝ ඉලක්කයට ගමන් කිරීම (Performing) යන අදියර හතරක් යටතේ බව ප්‍රකට කරුණකි.

ලොව සෑම රටක ම විවිධ මට්ටම්වල ඇති සමාජ කණ්ඩායම් හා වෘත්තීය හෝ වෘත්තික කණ්ඩායම් බිහි වූ පරිදි ම පුස්තකාලය සේවාව සඳහා ද එම තත්ත්වය සාධාරණ ය. ලෝක පුස්තකාලය ඉතිහාසය දෙස නිරීක්‍ෂණයේ දී ඇමරිකා එක්සත් ජනපදයට විශේෂ තැනක් හිමි වෙයි. පුස්තකාලය විද්‍යා ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා ඇමරිකානුවන් දක්වා ඇති දායකත්වය ඒ අතරින් කැපී පෙනේ. කොන්ග්‍රස් පුස්තකාලය වැනි දැවැන්ත ඥාන ගබඩාවක් බිහිකිරීමට අමතර ව පුස්තකාලය වෘත්තියේ වර්ධනය උදෙසා ද ඉමහත් මෙහෙයක් එකී ඉසුරුමත් රාජ්‍යය මගින් ඉටුකර ඇත.

නූතන ලෝකයේ ප්‍රබලතම හා විශාලතම පුස්තකාලය වෘත්තීය සංගමය වන ඇමරිකානු පුස්තකාලය සංගමය (ALA) ආරම්භ වූයේ (Britanica, 1985, P.53) 1876 දී ය. බොස්ටන් මහජන පුස්තකාලයේ පුස්තකාලයාධිපති ජස්ටින් වින්සර් මෙම සංගමයේ ප්‍රථම සභාපතිවරයා වූ අතර මෙල්විල් ඩිවී ප්‍රථම ලේකම්වරයා විය. එදා මෙම සංගමය පිහිටුවීමේ අරමුණු කීපයක් පහත සඳහන් කර ඇත.

(අ). මහජන පුස්තකාලයවල තත්ත්වය උසස් කිරීම

(ආ). පුස්තකාල ව්‍යාපාරය සඳහා මහජන ආධාර වැඩි කිරීම

(ඇ). පුස්තකාල වෘත්තියේ සම්භාවනීයතාව වර්ධනය කරගැනීම

1876 ඔක්තෝබර් 06 දින ෆිලඩෙල්පියාවේ පැවති තුන් දින සමුළුවක දී ඇමරිකානු පුස්තකාලය සංගමයෙහි ආරම්භය සිදු වී ඇත. ප්‍රථම සමුළුව

සඳහා පුස්තකාලය වෘත්තිකයන් 103 ක් සහභාගි වූ බව ද (ibid) සඳහන් වේ.

ඇමරිකාවේ පුස්තකාලය වෘත්තීය සංවිධාන අතර ඇමරිකානු පුස්තකාලය සංගමය වඩාත් ප්‍රමුඛතම හා පෞරාණික වෘත්තීය සංවිධානය වශයෙන් ගෞරවාදරයට පාත්‍ර වී ඇත. එසේ ම වර්තමාන ලෝකයේ ක්‍රියාත්මක විශාලතතම හා මහත් බලපෑමක් කළ හැකි පුස්තකාලය සංගමය ද වශයෙන් ගෞරවයට ලක් වී ඇත. බුද්ධිමය නිදහස ආරක්ෂා කිරීමට ද, උසස් තත්ත්වයේ පුස්තකාලය හා තොරතුරු සේවාවන් ප්‍රචලිත කිරීම සඳහා ද මේ සංගමය පෙරමුණ ගෙන ඇත. සකලවිධ විඥාපන හා තොරතුරුවලට ඇති මහජන ප්‍රවේශය ආරක්ෂා කරන අතර ම අනාගතයේ දී පුස්තකාලය භාවිතකරන පිරිසට එම වරප්‍රසාදය භුක්ති විඳීමේ හැකියාව ඇතිකිරීමට ඇමරිකානු පුස්තකාලය සංගමය ඇප කැප වී ඇත.

## 2. පුස්තකාලය වෘත්තියට අදාළ ජාත්‍යන්තර හා ජාතික සංවිධාන

පුස්තකාලය සේවය හා පුස්තකාලය අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමෙහි ලා ක්‍රියාත්මක වන සංවිධාන ජාත්‍යන්තර හා ජාතික සංවිධාන වශයෙන් ප්‍රධාන කොටස් දෙකක් යටතේ වර්ගීකරණය කළ හැකිය. පුස්තකාලය වෘත්තියට අදාළ ජාත්‍යන්තර හා ජාතික සංවිධාන රාශියක් වර්තමානයේ ක්‍රියාත්මක වේ. විද්වත් සංවිධාන හෝ වෘත්තීය සංවිධාන වශයෙන් ඒවායේ අරමුණු හා පරමාර්ථ යටතේ කෙරෙන සේවාවන් අනුව වෙන් වෙන් වශයෙන් හඳුනාගත හැකිය. පුස්තකාලය සේවාවේ හා පුස්තකාලය වෘත්තියෙහි ප්‍රවර්ධනය සඳහා විවිධ ක්ෂේත්‍ර යටතේ සේවා සපයන ආයතන හෝ සංවිධාන කීපයක් පහත සඳහන් කරනු ලැබේ.

(අ). පුස්තකාලය සංගම් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (IFLA)

(ආ). පුස්තකාලය හා තොරතුරු විද්වතුන්ගේ වරලත් ආයතනය (IIS)

(ඇ). පොදු රාජ්‍ය මණ්ඩලීය පුස්තකාලය සංගමය (COMLA)

(ඈ). එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය (UNESCO)

මේ සෑම ජාත්‍යන්තර සංවිධානයක ම අරමුණු, පරමාර්ථ හා කාර්යභාරය අධ්‍යයනය කිරීම මඟින් පුස්තකාලය සේවයේ ප්‍රගමනයට කෙරෙන සේවාව නිවැරැදි ව හඳුනා ගැනීමට පහසුවක් වෙනු ඇත. එකී විද්වත් වෘත්තීය සංවිධානවල කාර්ය භාර්ය පහත දැක්වෙන අයුරින් පෙළගැස්විය හැකිය.

(අ). පුස්තකාලය කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමිතිකරණය

(ආ). තොරතුරු දත්ත, උත්පාදනය, හුවමාරුව හා ප්‍රකාශනය

(ඇ). අන්තර්ජාතික තොරතුරු පද්ධති ඇසුරෙන් තොරතුරු හා සේවා සැපයීම

(ඈ). තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළ ජාලයන් හා සම්බන්ධ කරවීම

(ඉ). දියුණු වෙමින් පවත්නා රටවල් සඳහා ආධාර හා උපදේශනය ලබා දීම

(ඊ). ප්‍රලේඛන කටයුතු සඳහා විශේෂඥ උපදෙස් ලබා දීම හා පුහුණු පාඨමාලා පැවැත්වීම

(උ). පුස්තකාලය සංගම්වලින් ගනු ලැබූ තීරණ, වාර්තා හා ලිපි පිළිබඳ ව අන්තර්ජාලය ඔස්සේ තොරතුරු මුදා හැරීම

පුස්තකාලය සේවාව දියුණු සෑම රටක ම පුස්තකාලය වෘත්තියට අදාළ කිසියම් සංවිධානයක් හෝ සංවිධාන ක්‍රියාත්මක වීම පොදුවේ දක්නට ලැබෙන තත්ත්වයකි. පුස්තකාලය වෘත්තියට අදාළ වඩාත් ප්‍රචලිත ජාතික සංවිධාන ඇමරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍යය, ප්‍රංශය, ජපානය හා සිංගප්පූරුව වැනි රටවල ද, දකුණු ආසියානු කලාපයේ රටවල ද ක්‍රියාත්මක වේ. දකුණු ආසියානු කලාපයේ රටවල් අතරෙන් ඉන්දියාව බලවතෙකි. ඉන්දියානු පුස්තකාලය සංගමයට අමතරව ප්‍රාන්ත සඳහා ද විවිධ පුස්තකාලය සංගම් ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකාවේ පළාත් හෝ ප්‍රාදේශීය වශයෙන් පුස්තකාලය සංගම් ක්‍රියාත්මක නොවන අතර ජාතික වශයෙන් ක්‍රියාත්මක වන්නේ ශ්‍රී ලංකා පුස්තකාලය සංගමය යි.

## 3. ශ්‍රී ලංකාවේ පුස්තකාලය වෘත්තියට අදාළ සංවිධානවල අවශ්‍යතාව

ශ්‍රී ලංකාවේ පුස්තකාලය සේවාවේ සංවර්ධනය උදෙසා වෘත්තික හෝ වෘත්තීය සංවිධාන අවශ්‍යව ඇත්තේ මතු දක්වෙන ගැටලු හා ඒවාට සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය පිණිසත්, කාලෝචිතව වැදගත් වන කරුණු පිළිබඳ විශේෂාවධානයත් සඳහා ය. ඒවා නම්,

(අ). පුස්තකාලය සේවාවට අදාළ නායකත්වය පිළිබඳ ගැටලුව ශ්‍රී ලංකාවේ පුස්තකාලය සේවාව සංවර්ධනයට අදාළ නායකත්වය විවිධ ආයතනවලට බෙදී වෙන් වී ඇත. ඒ නිසා එක් අරමුණක් යටතේ සංවිධානයවීම කාලීන අවශ්‍යතාවකි.

(ආ). පුස්තකාලය සේවාව සංවර්ධනයට සැලසුම්ගත වැඩපිළිවෙළක්, එනම් උපායමාර්ගික සැලැස්මක් අත්‍යවශ්‍ය වීම.

(ඇ). වෘත්තීය ආයතන ඒකාබද්ධවීම හෙවත් එක් අභිමතාර්ථයක් අරමුණු කරගෙන සංවිධානයවීම.

මෙම කාර්යභාරය මෙහෙයවන නායකත්වය ඍජු, අවංක හා සටන්කාමී විය යුතුය. ඒ සඳහා ජාතික පුස්තකාලය හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාලය හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, ජාතික පුස්තකාලය හා විඥාපන විද්‍යා ආයතනය, ශ්‍රී ලංකා පුස්තකාලය සංගමය හා ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමය වැනි සංගම් හෝ ආයතන ඒකාබද්ධ වී අදාළ සේවා පරිසරයට අනුව කටයුතු කළ යුතුය.

(ඈ). දුක්ගැනවිලි පිළිබඳ ව සාකච්ඡා කෙරෙන විධිමත් රාමුවක් අවශ්‍ය වීම උදාහරණ වශයෙන් පුස්තකාල හා විඥාපන විද්‍යා කොමිෂන් සභාවක් පිහිටුවා ගැනීම හෝ දුක්ගන්නාරාළ කෙනෙකු පත්කර ගැනීම යෝජනා කෙරේ.

(ඉ). වෘත්තීය පාඨමාලා නවීන සමාජ, ආර්ථික අවශ්‍යතා හා තොරතුරු තාක්ෂණික අවශ්‍යතා අනුව යාවත්කාලීන කර සංවර්ධනය කිරීම.

ශ්‍රී ලංකාවේ පුස්තකාලය සේවාවේ සංවර්ධනය සඳහාත්, පුස්තකාලය වෘත්තියේ සංවර්ධනය සඳහාත් වර්ෂ 1960 සිට 2014 දක්වා වෘත්තීය වශයෙන් හා වෘත්තියික වශයෙන් ක්‍රියාත්මක වූ හා ක්‍රියාත්මක වන සංවිධාන කීපයක් පිළිබඳ ව තොරතුරු විවිධ මූලාශ්‍රවල සඳහන් වේ. මෙම සංගම්වලින් වෙනත් පුස්තකාලය සංගම් හා සංවිධාන බිහි වී ඇති අතර මෑත කාලීනව විවිධ අරමුණු සහිත පුස්තකාලය සංගම් ද බිහි වී ඇත. එකී සංවිධානවලින් සමහර සංවිධාන 2014 වන විට ක්‍රියාකාරී තත්ත්වයක නො පවතී.

ශ්‍රී ලංකාවේ පුස්තකාලය සේවාවේ සංවර්ධනය සඳහාත්, පුස්තකාලය වෘත්තියේ සංවර්ධනය සඳහාත් වෘත්තීය වශයෙන් හා වෘත්තියික වශයෙන් ක්‍රියාත්මක වූ සංවිධාන කීපයක් 60 දශකයේ (අ). ලංකා පුස්තකාල සංගමය, (ආ). උතුරු ලංකා පුස්තකාල සමිතිය, (ඇ). පාසැල් පුස්තකාල සමිතිය, (ඈ). රජයේ පුස්තකාලයාධිපති වෘත්තීය සමිතිය හා (ඉ). සමස්ත ලංකා පළාත් පාලන සේවා පුස්තකාලයාධිපතින්ගේ සමිතිය වශයෙන් සංවිධාන පහක් පැවති බව සඳහන් වේ. **(කොරයා, 1969 පි. 1181)**

ශ්‍රී ලංකාවේ පුස්තකාලය වෘත්තියට අදාළ වෘත්තික හා වෘත්තීය සංවිධාන පිළිබඳවත්, ඒවායේ ආරම්භය පිළිබඳවත් පුස්තකාලය විද්‍යා සාහිත්‍යමය කරුණු එක් මූලාශ්‍රයකින් සපයා ගැනීම අතිශය දුෂ්කර ය. එකී අවශ්‍යතාව කිසියම් අයුරකින් විසඳා ගැනීමට අවශ්‍ය පදනම සැකසීම සඳහා දැනට නිවැරදි තොරතුරු සපයා ගැනීමට හැකි වූ සංවිධාන කීපයක මූලික කරුණු මෙම ලිපියෙහි සඳහන් වේ. අනාගත අධ්‍යයන කටයුතුවලට ප්‍රයෝජනවත් වන හෙයින් අධ්‍යයනයට අදාළ සංවිධාන ආරම්භය හා මංගල සභාවාරයේ දී තෝරාපත් කර ගත් නිලධාරි මණ්ඩලය පිළිබඳවත් මෙම ලිපියෙහි තොරතුරු සඳහන් කෙරේ. එකී සංවිධාන ඒවායේ ආරම්භක වර්ෂය පාදක කර ගෙන මෙහි දී පෙළ ගස්වා ඇත.

3.1. ශ්‍රී ලංකා පුස්තකාලය සංගමය (ලංකා පුස්තකාලය සංගමය) 1960

3.2. ශ්‍රී ලංකා පුස්තකාලය සේවා වෘත්තීය සමිතිය 1973

3.3. උපාධිධාරී පුස්තකාලයාධිපතින්ගේ හා විඥාපන විද්‍යාඥයන්ගේ ජාතික සංගමය 1978

3.4. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමය 1981

3.5. එක්සත් මහජන පුස්තකාලය සංගමය 1984

3.6. කාර්මික අධ්‍යාපන පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමය 1985

3.7. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය පුස්තකාල සහකාර නිලධාරින්ගේ සංගමය 1992

3.8. නැගෙනහිර පළාත් පුස්තකාලය සේවක සංගමය 1992

3.9. රාජ්‍ය සේවා පුස්තකාලයාධිපති සංගමය 1994

3.10. බස්නාහිර පළාතේ පළාත් පාලන පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමය 1998

3.11. පුස්තකාලය හා විඥාපන විද්‍යා ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය 2002

3.12. රාජ්‍ය සේවා ඒකාබද්ධ පුස්තකාලයාධිපතිවරුන්ගේ වෘත්තීය සංගමය 2006

3.13. පළාත් රාජ්‍ය සේවා පුස්තකාලය වෘත්තීයවේදීන්ගේ සංගමය 2007

3.14. සමස්ත ලංකා පළාත් පාලන උපාධිධාරී පුස්තකාලයාධිපතින්ගේ සංගමය 2007

## 3.1. ශ්‍රී ලංකා පුස්තකාල ය සංගමය (ලංකා පුස්තකාලය සංගමය)

ශ්‍රී ලංකාවේ පුස්තකාලවල හා පුස්තකාලය වෘත්තියෙහි සදානුස්මරණීය දිනයක් වශයෙන් 1960 අගෝස්තු මස 28 වන දිනය ඉතිහාසගත වී ඇත. ශ්‍රී ලංකා පුස්තකාලය සංගමයේ සඳහා ලැබී ඇති නෛතික පිළිගැනීම අධ්‍යයනය කිරීම ද එහි වටිනාකම හා වැදගත්කම දිනෙන් දින වර්ධනයට හේතුවකි. පුස්තකාලය සංගමය මතු දැක්වෙන පාර්ලිමේන්තු පනත්වල සඳහන් විධිවිධාන හා නෛතික තත්ත්වය මත ක්‍රියාත්මක වන ජාතික සංවිධානයකි.

**3.12.** රාජ්‍ය

(අ). ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 20 දරන ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

(ආ). 2004 අංක 7 දරන ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත

උක්ත සඳහන් පසුබිම යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා පුස්තකාලය සංගමයේ ආරම්භය පිළිබඳ අධ්‍යයනය කිරීම එහි ඇති සම්භාවනීයත්වයට නිදසුන් සපයනු ඇත. "මේ සංගමය පිහිටුවීම ලංකා පුස්තකාලය සංවර්ධන ඉතිහාසයේ පෙරට තැබූ ප්‍රධානත ම පියවර ලෙස මම සලකමි. මෙය නව යුගයක ආරම්භය යි." ඒ ශ්‍රී ලංකා පුස්තකාලය සංගමයේ ආරම්භක රැස්වීම අමතා පුස්තකාලය පිළිබඳ යුනෙස්කෝ විශේෂඥ හැරල්ඩ් වී. බොනී කළ ප්‍රකාශය යි. **(ලංකාගේ, 1975 පි. 67)** පුස්තකාලය ව්‍යාපාරය දියුණු කිරීමට පුස්තකාලය සංගමයට ඇති වගකීම ඒ ප්‍රකාශයෙන් ම පැහැදිලි ය. එසේ නව යුගයක් ආරම්භ කිරීමේ වගකීම පවරා ගත් මෙරට පුස්තකාලය වෘත්තීය බල මණ්ඩලය වූ පුස්තකායල සංගමය මෙරට පුස්තකාලය ව්‍යාපාරයේ බොහෝ අවස්ථාවල දී පෙරමුණ ගෙන ඇත.

ශ්‍රී ලංකා පුස්තකාලය සංගමය (ලංකා පුස්තකාලය සංගමය) ආරම්භ කරන ලද්දේ 1960 අගෝස්තු මාසයේ දී ය. **(පියදාස, 1985 පි. 5)** පුස්තකාලය වෘත්තියට සංගමයක අවශ්‍යතාව ගැන මෙයට පෙර වරින් වර ඇති වූ උනන්දුව හා යෝජනා කෙරෙහි සැලකිල්ලක් දැක් වූ එම්.ජේ. පෙරේරා මහතා විසින් රැස්වීමක් කැඳවන ලදී. ඔහු විසින් එවකට සිටි පුස්තකාලයාධිපතිවරුන් රාජකීය විද්‍යාලයේ රැස්වීම් ශාලාවට කැඳවා පුස්තකාලය සංගමයක් ඇති කර ගැනීමේ අවශ්‍යතාව ඔවුනට පැහැදිලි

කළ අතර ඉන් පසුව ව්‍යවස්ථා මාලාවක් සකස් කර ගැනීම සඳහා කමිටුවක් ද පත් කෙරිණි. මෙම කමිටුව විසින් සකස් කළ ව්‍යවස්ථා මාලාව සම්මත කළ ප්‍රථම මහ සභා රැස්වීම පවත්වන ලද්දේ 1960 අගෝස්තු මස 28 වෙනි දින **(එහි ම)** ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය (Ceylon Institute of Sciencetific and Industrial Research - CISIR) හෙවත් වර්තමාන කාර්මික තාක්ෂණික ආයතනය (Industrial Technoloy Institute - ITI) ශ්‍රවණාගාරයේ දී ය.

1974 අංක 20 දරන ශ්‍රී ලංකා පුස්තකාලය සංගමය (සංස්ථාගත කිරීමේ) පනත වර්ෂ 2004 දී සංශෝධනය කර 2004 අංක 7 දරන ශ්‍රී ලංකා පුස්තකාලය සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් වර්තමානයේ ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකා පුස්තකාලය සංගමය පිහිටුවීමේ පරමාර්ථ ව්‍යවස්ථා මාලාවේ දැක්වෙන අන්දමට මෙසේ ය.

- ශ්‍රී ලංකාවේ පුස්තකාලය පිහිටුවීම, ව්‍යාප්ත කිරීම හා දියුණු කිරීම වෘත්තීය ප්‍රමිති ස්ථාපන කිරීම.
- ග්‍රන්ථ විද්‍යාත්මක ප්‍රශ්න හා පුස්තකාලයවලට බලපාන කරුණු සාකච්ඡා කිරීම සඳහා සම්මේලන හා රැස්වීම් පැවැත්වීමෙන් පුස්තකාලය කටයුතුවල නිරත වූ හෝ ඒවා කෙරෙහි උනන්දුවක් දක්වන සියල්ලන් එක් කිරීම.
- පුස්තකාලයාධිපති වෘත්තියෙහි නියුතු සාමාජිකයන්ගේ යහපත සුබසිද්ධිය අයිතිවාසිකම් හා වරප්‍රසාද ආරක්ෂා කිරීම සහ වර්ධනය කිරීම.
- පුස්තකාලයාධිපතිවරුන් පුහුණු කිරීම හා පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ වෘත්තීය විභාග පවත්වා ප්‍රවීණත්වය පිළිබඳ සහතික නිකුත් කිරීම.
- ශ්‍රී ලංකාවේ පුස්තකාලයන් අතර වඩාත් සමීප සමායෝජනය හා සහයෝගය වර්ධනය කිරීම.
- ග්‍රන්ථ විද්‍යාව පිළිබඳ අධ්‍යයනය හා පර්යේෂණ කටයුතු කිරීම.
- වෘත්තීය පොත් පත් එකතු කොට ප්‍රකාශ කිරීම, වර්ධන කිරීම හා ඒවාට උනන්දු කරවීම.
- වෘත්තීය පොත් පත් එකතු කොට පුස්තකාලයක් පවත්වා ගෙන යාම.

ඉහත සඳහන් පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට හිතකර වූ අන් සියලු කටයුතු කිරීම. උක්ත පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා මනාව සංවිධානය කරන ලද පාලන පද්ධතියක් තිබේ. ශ්‍රී ලංකා පුස්තකාලය සංගමයේ පාලක මණ්ඩලය වනුයේ පාලක සභාවයි. එයට සහාය වීමට විධායක කමිටුවක් ඇත.

ශ්‍රී ලංකා පුස්තකාලය සංගමයේ සාමාජිකත්වය ලබාගැනීමට පුස්තකාලය හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව සමත්වීම හෝ ඒ හා සමාන සුදුසුකම් අවශ්‍ය වේ. 1961-62 ලංකා පුස්තකාලය සංගමයේ විධායක සභාවේ නියෝජිතයන්ගේ නම් පහත සඳහන් වේ.

| | |
|---|---|
| සභාපති | එස්.සී. බ්ලොක් මහතා |
| උප සභාපතිවරු | මාග්‍රට් ගුණරත්න මහත්මිය,<br>ඊශ්වරී කොරයා මහත්මිය |
| ගරු ලේකම් | මානිල් සිල්වා මෙනවිය |
| සහකාර ලේකම් | විල්ෆ්‍රඩ් එම්. ගුණසේකර මහතා |
| භාණ්ඩාගාරික | එස්.එම්. කමල්ඩීන් මහතා |
| අධ්‍යාපන නිලධාරි | වී. මහලිංගම් මහතා |
| ස.අධ්‍යාපන නිලධාරි | ක්ලෝඩා නෙත්සිංහ මෙනවිය |

පහත සඳහන් වන පුස්තකාලය වර්ග නියෝජනය සඳහා නියෝජිතයන් දෙදෙනා බැගින් තෝරාපත් කර ගෙන ඇත.

විශේෂ පුස්තකාලය නියෝජනය

දයා ගුණසේකර මහතා — ඩී. එස්. ජයසේකර මහතා

මහනගර සභා මහජන පුස්තකාලය නියෝජනය

එන්. පෙරේරා මහත්මිය — ඊ. ඩී. ටී. කුලරත්න මහතා

මහනගර සභා තත්ත්වය නොලත් පළාත් පාලන ආයතන පුස්තකාලය නියෝජනය

ෆීලික්ස් සමරත්න මහතා — එෆ්. එස්. පීරිස් මහතා

රජයේ දෙපාර්තමේන්තු පුස්තකාලය නියෝජනය

එම්. ඩී. ආර්. පෙරේරා මහතා — ඩෙනිස් ද අල්මේදා මහතා

විශ්වවිද්‍යාල පුස්තකාලය නියෝජනය

කේ. ඩී. සෝමදාස මහතා — ටී. ජී. පියදාස මහතා

පාසල් හා අධ්‍යාපන ආයතන පුස්තකාලය නියෝජනය

ආර්.එස්. තම්බයියා මහතා     ඩී.ඩී.පී. නානායක්කාර මහතා

ශ්‍රී ලංකාවේ පුස්තකාලය හා විඥාපන විද්‍යා අධ්‍යාපනයෙහි ප්‍රමුඛතම හා සමාරම්භක ආයතනය වශයෙන් ශ්‍රී ලංකා පුස්තකාලය සංගමය මෙරට පුස්තකාලය විද්‍යා අධ්‍යාපනය නංවාලීමේ අරමුණින් අර්ධ කාලීන පාඨමාලා ආරම්භ කරන ලදී. පුස්තකාලය විද්‍යා අධ්‍යාපනය ආරම්භ කිරීමෙන් පුස්තකාලය සංගමය බලාපොරොත්තු වූ තවත් අභිප්‍රායන් දෙකක් විය. ඒවා නම් සංගමයේ ආශ්‍රය සාමාජිකත්වය ලබාදීම හා වරලත් පුස්තකාලයාධිපතිවරුන්ගේ නාම ලේඛනයක් ආරම්භ කිරීමත් ය. **(ලංකාගේ, 1975 පි. 68)** 2004 අංක 7 දරන ශ්‍රී ලංකා පුස්තකාලය සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත යටතේ සාමාජිකත්වය සංස්ථාගත සාමාජිකත්වය හා සංස්ථාගත නොවන සාමාජිකත්වය වශයෙන් ස්වරූප දෙකකි. සංස්ථාගත සාමාජිකයන් සම්මාන සාමාජිකයන් හා ආශ්‍රිත සාමාජිකයන් වශයෙන් වර්ග කෙරෙන අතර ඔවුන්ට ඡන්දය භාවිත කළ හැකිය.

ශ්‍රී ලංකා පුස්තකාලය සංගමයට 2014 වර්ෂය වන විට අවුරුදු 54ක් ගත වූ හෙයින් ශ්‍රී ලංකා පුස්තකාලය සංගමය පමණක් ජාතික සංවිධානයක් වශයෙන් වර්ෂ 2010 දී සිය ස්වර්ණ ජයන්තිය ද (1960-2010) අනුස්මරණය කෙරිණි. ශ්‍රී ලංකා පුස්තකාලය සංගමයේ පුස්තකාලය හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව (DIPLIS) 2011 වර්ෂය වන විට අදියර තුනක් යටතේ අධ්‍යයනය කළ හැකි ය. ඒවා නම් පුස්තකාලය හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව I අදියර, පුස්තකාලය හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව II අදියර හා පුස්තකාලය හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව III අදියර වශයෙනි. ඩිප්ලෝමාව ලබාගැනීම සඳහා අවම වශයෙන් වසර තුනකට වඩා වැඩි කාලයක් ගත වේ. ශ්‍රී ලංකා පුස්තකාලය සංගමයේ සභාපති තනතුරට පත් වූ ප්‍රවීණ පුස්තකාලය වෘත්තිකයන්ගේ නම් අංක 01 දරන උපැඳියෙහි සඳහන් කෙරේ. එකී කාලානුක්‍රමණිකාව සම්පාදනය කරන ලද්දේ වර්ෂ අනුපිළිවෙළිනි.

ශ්‍රී ලංකාවේ පුස්තකාලය වෘත්තියක් බිහිවීමට ශ්‍රී ලංකා පුස්තකාලය සංගමය කොපමණ දායකත්වයක් ලබා දී තිබේ දැයි විමසීමේ දී එකී සංගමය ආරම්භ වීමෙන් පසු මෙරට පුස්තකාලය සේවාවට මතු දැක්වෙන කරුණු සම්බන්ධයෙන් සපයන ලද දායකත්වය විමර්ශනය කිරීමෙන් පැහැදිලි වේ.

(අ). පුස්තකාලය ප්‍රමිති හා සම්මතයන් සකස්කර ගැනීම.

(ආ). පුස්තකාලය සේවාවට අදාළ නීතිමාලා සම්පාදනය කිරීම.

(ඇ). පුස්තකාලය සේවාවට අදාළ බඳවාගැනීම් පිළිබඳ නිර්ණායක හා පිරිවිතර සකස්කිරීම.

(ඈ). වෘත්තියක අඛණ්ඩතාව උදෙසා මානව සම්පත ප්‍රවර්ධනය කිරීම.

(ඉ). පර්යේෂණාත්මක කටයුතු හා පුහුණු පාඨමාලා පවත්වා සහතිකපත් නිකුත් කිරීම.

(ඊ). වෘත්තීය ආචාරධර්ම හා සාරධර්ම හඳුන්වා දී වෘත්තිකයන් ඒවාට අනුගත කිරීම.

(උ). ගුණාත්මකභාවය සතුටුදායක තත්ත්වයකින් ස්ථාපිත කර ගැනීම.

වෘත්තිකයයන් වෙනුවෙන් පුස්තකාලය සංගමය විසින් වෘත්තීය සංවිධානයක් වශයෙන් පහත සඳහන් කරුණු කෙරෙහි ද තම මෙහෙවර ව්‍යාප්ත කළ යුතුය.

(අ). ශ්‍රී ලංකාවේ පුස්තකාලය හා විඥාපන විද්‍යා පාඨමාලා ඇගැයීම හා ප්‍රමිති සකස් කිරීම.

(ආ). වෘත්තීය තත්ත්වය ආරක්‍ෂා වන අයුරින් සුදුසුකම් (පිරිවිතර) තීරණය කිරීම.

(ඇ). පුස්තකාලය වෘත්තිකයන්ගේ වෘත්තීයමය අයිතිවාසිකම් ලබාගැනීමට කටයුතු කිරීම.

(ඈ). පුස්තකාලය වෘත්තිකයන්ගේ ගෞරවය ආරක්‍ෂා කොට ඔවුන් තම වෘත්තිය හැර යාම වළක්වා ගැනීමට කටයුතු කිරීම.

ශ්‍රී ලංකා පුස්තකාලය සංගමය ඉහත කාර්යයන් කිරීමට අවධානය යොමු කිරීම මෙරට පුස්තකාලය වෘත්තියේ නියුක්ත පුස්තකාලය වෘත්තිකයන්ගේ සැබෑ අවධානයට ලක්වන කරුණක් වන අතර මෙරට පුස්තකාලය වෘත්තිය සංවර්ධනය සඳහා ද වඩාත් ප්‍රතිඵලදායි පියවරක් වනු ඇත.

### 3.3. උපාධිධාරි පුස්තකාලයාධිපතින්ගේ හා විඥාපන විද්‍යාඥයන්ගේ ජාතික සංගමය

ශ්‍රී ලංකා පුස්තකාලය සංගමයේ සාමාජිකත්වය පුස්තකාලය විද්‍යා පාඨමාලා හදාරන ශිෂ්‍යයන්ට ද ලබාගැනීමේ හැකියාවක් පැවති අවස්ථාවක පුස්තකාලය සංගමයේ බලය වෘත්තියට සම්බන්ධ නොවන

පිරිසකට හිමිවීමේ ප්‍රවණතාවක් නිර්මාණය විය. ඒ අනුව පුස්තකාලය සේවාවට සම්බන්ධ නොවන හා අර්ධ වෘත්තීය පුහුණුවක් සහිත පිරිසක් සංගමයේ කටයුතුවල දී ප්‍රබලව කටයුතු කිරීම නිසාවෙන් වෘත්තීය පුහුණුවක් සහිත පුස්තකාලයාධිපතිවරුන්ට වෙනත් වෘත්තීය සංවිධානයක් පිහිටුවා ගැනීම කාලීන අවශ්‍යතාවක් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් **උපාධිධාරි පුස්තකාලයාධිපතින්ගේ හා විඥාපන විද්‍යාඥයන්ගේ ජාතික සංගමය** (National Association for Graduate Librarians and Information Scientists-NAGLIS) වර්ෂ 1978 දී පමණ **(ලංකාගේ 1980, පි. 29)** ආරම්භ විය. මෙම සංගමයෙහි සාමාජිකත්වය උපාධිධාරී වෘත්තීය පුස්තකාලයාධිපතිවරුන්ට හා විඥාපන විද්‍යාඥයන්ට පමණක් සීමා විය.

උපාධිධාරී පුස්තකාලයාධිපතින්ගේ හා විඥාපන විද්‍යාඥයන්ගේ ජාතික සංගමය ආරම්භ කිරීමෙහි ලා මූලිකත්වය ගෙන කටයුතු කරන ලද්දේ මහාචාර්ය ජයසිරි ලංකාගේ මහතා ඇතුළු එවක විශ්වවිද්‍යාල පුස්තකාලයවල සේවය කළ පුස්තකාලය වෘත්තිකයන් බව විශේෂයෙන් සඳහන් කළ යුතුය. වර්තමානයේ මෙය ක්‍රියාත්මක නොවන සංවිධානයකි.

උපාධිධාරී පුස්තකාලයාධිපතින්ගේ හා විඥාපන විද්‍යාඥයන්ගේ ජාතික සංගමය බිහිකිරීමට හේතු වූ කරුණු අදාළ සමාජ සාධක හා පරිසරය පිළිබඳ ව මූලික ව කටයුතු කළ පුස්තකාලය සේවාවේ ප්‍රවීණයෙක් වශයෙන් මහාචාර්ය ජයසිරි ලංකාගේ නාමය ප්‍රචලිත ය. වර්ෂ 1982 වන විට එතුමා කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාලය හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශයේ අංශ ප්‍රධාන හා සහාය මහාචාර්යවරයකු වශයෙන් සේවය කර තිබුණි. උපාධිධාරී පුස්තකාලයාධිපතින්ගේ හා විඥාපන විද්‍යාඥයන්ගේ ජාතික සංගමය නිර්මාණය කිරීමට පාදක වූ කරුණු පිළිබඳ ව විශ්‍රාමික මහාචාර්ය ජයසිරි ලංකාගේ මහතාගේ වචනවලින් ම එය මෙසේ සංක්ෂිප්තව සඳහන් කළ හැකිය.

"මෙරට පුස්තකාලය වෘත්තියට අදාළ බොහෝ ප්‍රශ්න එනම්, අඩු වැටුප් හා වරප්‍රසාද, සේවා තත්ත්ව ගැටලු ආදියට මූලික හේතුවක් ව පවතින්නේ පුස්තකාලයාධිපති වෘත්තිය උපාධිධාරි වෘත්තියක් නොවීම බව මා එදා මෙන් ම අදත් විශ්වාස කරනවා. එනිසා මා උපාධිධාරී පුස්තකාලය හා විඥාපන විද්‍යා වෘත්තිකයන්ගේ ජාතික සංගමය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වූයේ මෙරට උපාධිධාරී පුස්තකාලය වෘත්තිකයන් ඒකරාශි කරමින් වෘත්තියේ ඉදිරි මඟ වඩා යහපත් තත්ත්වයකට ගෙන ඒමයි. එහෙත් පසුකලෙක ශ්‍රී ලංකා පුස්තකාලය සංගමය නැවත නිවැරැදි මාර්ග යට පිවිස විද්වත් පුස්තකාලය වෘත්තිකයන් අතට පත්වීම නිසා උපාධිධාරී පුස්තකාලයාධිපතින්ගේ හා විඥාපන විද්‍යාඥයන්ගේ ජාතික සංගමය

වැනි සංගමයක් විශේෂයෙන් ඉදිරියට ගෙන යාමට අවශ්‍යතාවක් මතු වූයේ නැහැ." **(තිස්ස, 2012 පි. 113)**

ශ්‍රී ලංකාවේ පුස්තකාලය සේවාව පිළිබඳ ව මධ්‍යස්ථ ව තීරණ හා තීන්දු ගැනීමක දී උපාධිධාරී පුස්තකාලයාධිපතින්ගේ හා විඥාපන විද්‍යාඥයන්ගේ ජාතික සංගමයක අවශ්‍යතාව පැවතීම වෙනත් වෘත්තීය සංගම් නිවැරැදි දිසාවට අවතීර්ණ කර ගැනීමට හේතු සාධක වන බවත්, එවැනි සංගමයකට මහත් වගකීම් සම්භාරයක් පැවරෙන බවත් මෙහි දී විශේෂයෙන් සඳහන් කළ යුතුය.

**3.4. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමය**

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිත්වයට අදාළ වෘත්තීය සංගම් මුල් අවධියේ දී නො පැවතුණෙන් ඔව්හු ද විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමයේ (University Teachers' Association –UTA) හා විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ ඒකාබද්ධ සංගම් සංවිධානයේ (Federation of University Teachers' Association–FUTA) සාමාජිකත්වය දැරුවෝය. එහෙත් එම සංගම්වලින් පුස්තකාලයාධිපතිවරුන්ට වැදගත් හා අවශ්‍ය ඇතැම් කරුණු ගැන වැඩි අවධානයක් නො යොදවන ලද පසුබිමක තම ක්ෂේත්‍රයට අදාළ වන පරිදි වෘත්තික හෝ වෘත්තීය සංවිධානයක අවශ්‍යතාව විශ්වවිද්‍යාල පුස්තකාලය සේවාවට අදාළ ඉතිහාසයෙන් පෙන්නුම් කෙරේ.

පේරාදෙණිය විශ්වවිද්‍යාල පුස්තකාලයට අදාළ ව ඇති වූ අවාසනාවන්ත සිද්ධි කීපයක් ම පුස්තකාලයාධිපතිත්වයට අදාළ වෘත්තීය සමිතියක අවශ්‍යතාව දිනෙන් දින සමස්ත විශ්වවිද්‍යාල පුස්තකාලය සේවාවට ම ඒත්තු ගන්වන ලදි. විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමය ආරම්භ වීමට තදාසන්න කරුණු තුනක් (3) පාදක වී ඇත. එම හේතු කිසියම් ශාස්ත්‍රීය පසුබිමක සාකච්ඡා කිරීම නුසුදුසු වුව ද, ඒවා හඳුනාග ැනීම අනාගත අධ්‍යයන හා පර්යේෂණ කටයුතුවල දී ප්‍රයෝජනවත් වේ යැයි අපේක්ෂා කෙරෙන හෙයින් ඒවා කරුණු වශයෙන් පමණක් සඳහන් කෙරේ.

(අ). නීති විරෝධී අයුරින් සහකාර පුස්තකාලයාධිපති තනතුරු සඳහා බඳවාගැනීම.

(ආ). ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන්ට ස්ථාන මාරු ලබා දීම.

(ඇ). පුස්තකාලයාධිපති තනතුරට සුදුසුකම් රහිත ව බඳවා ගැනීමට පිඹුරුපත් සැකසීම

පේරාදෙණියේ විශ්වවිද්‍යාලයේ පමණක් නොව යථෝක්ත අවාසනාවන්ත සිද්ධි කැලණිය විශ්වවිද්‍යාලය ඇතුළු අනෙකුත් ජාතික විශ්වවිද්‍යාල කීපයකම නිර්මාණය වෙමින් පැවති බවට සාක්ෂි ඇත. යථෝක්ත පසුබිම මෙම සංගමයේ සැබෑ ආරම්භය සිදු වූ බව ආරම්භක සාමාජිකයන් තහවුරු කරනු ඇත. ඒ අනුව වර්ෂ 1981 දී කොළඹ විශ්වවිද්‍යාලය පසුබිම් කර ගෙන මේ සංගමය ආරම්භ වී ඇති අතර ව්‍යවස්ථාවක් යටතේ සංගමයේ කටයුතු කෙරේ.

ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල විශ්වවිද්‍යාල පුස්තකාලයවල සේවයේ නියුතු වෘත්තීය තත්ත්වයෙහි ලා සැලකෙන පුස්තකාලයාධිපතිවරුන්, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් හා සහකාර පුස්තකාලයාධිපතිවරුන් දොළොස් දෙනෙක් ආරම්භක රැස්වීමට සහභාගි වූහ. (කොළඹ විශ්වවිද්‍යාලයෙන් හය දෙනෙකු හා සෙසු විශ්වවිද්‍යාල නියෝජනය කරමින් හය දෙනෙකු) එහි දී සංගමයේ ප්‍රථම සභාපතිවරයා වශයෙන් කොළඹ විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපති එම්.ඒ.පී. සේනාධීර (මාග මගේ ඒඩ්‍රියන් පෙරේරා සේනාධීර) හා ආරම්භක ලේකම්වරයා ලෙස කොළඹ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති වූ නීතිඥ මරික්කාර්/මරිකා ද, භාණ්ඩාගාරික තනතුරට පී. කුලරත්නම් ද තෝරාපත් කර ගෙන ඇත.

විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමයේ ආරම්භයේ දී එවක විශ්වවිද්‍යාලයවල සේවය කළ විශිෂ්ට පුස්තකාලයාධිපතිවරු මේ සංගමයේ ආරම්භක සාමාජිකයන් වශයෙන් කටයුතු කර ඇත. කොළඹ විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපති මාගමගේ ඒඩ්‍රියන් පෙරේරා සේනාධීර, පේරාදෙණිය විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපති නම්බුකාර තන්තිරිගේ සමරසිරි ආරියරත්න සේනාධීර, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපති විජේරත්න බණ්ඩාර දොරකුඹුර, කැලණිය විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපති තිරුප්පු වසම් ගාල්ලගේ පියදාස යන පිරිස් විශේෂයෙන් කැපී පෙනෙ මෙහෙවරක් කර ඇත. වයලට් ද සූසා, ඩබ්.ආර්. ගාමිණී ද සිල්වා, ජයසිරි ලංකාගේ, සුමනා ජයසූරිය, එන්.ඒ.ඩබ්.ඒ.ටී. අල්විස්, පියදාස විදානපතිරණ, එල්.ඒ. ජයතිස්ස යන වෘත්තිකයෝ ද, මෙහි දී ගෞරවයෙන් සිහිපත් කෙරේ.

සංගමයේ නිලධාරි මණ්ඩලය සඳහා සභාපති, උප සභාපතිවරු දෙදෙනෙක්, ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික, සංස්කාරක යන තනතුරු ද, සියලු ම ජාතික විශ්වවිද්‍යාල නියෝජනය වන පරිදි කාරක සභාව සාමාජිකයන් හය දෙනෙකු හා විගණන තනතුර සඳහාත් සාමාජිකයන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් වාර්ෂික සමුළුවේ දී නිලධාරි මණ්ඩලය තෝරාපත් කර ගනු ලැබේ. විශ්වවිද්‍යාල

පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමයේ ශාස්ත්‍රීය නිල ප්‍රකාශනය වශයෙන් Journal of the University Librarians' Association of Sri Lanka (JULA) ප්‍රකාශිත ය. එය වාර්ෂික ප්‍රකාශනයක් වන අතර භාෂා මාධ්‍ය තුනෙන් ම ලිපි ප්‍රකාශයට පත්කිරීම ආරම්භයේ සිදු විය. 2013 වර්ෂයේ සිට අර්ධ වාර්ෂිකව මේ සඟරාව ප්‍රකාශිත ය. වර්තමානයේ දී ශාස්ත්‍රීය හා පර්යේෂණ ලිපි ප්‍රකාශයට පත්වීමේ දී ඉංග්‍රීසි භාෂාවට ප්‍රමුඛස්ථානයක් දීම විශේෂත්වයක් වුවද රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට පිටුපෑමක් බව සඳහන් කළ යුතුය.

### 3.5. එක්සත් මහජන පුස්තකාලය සංගමය

එක්සත් මහජන පුස්තකාලය සංගමය වර්ෂ 1984 දී බදුල්ල දිස්ත්‍රික්කයේ ආරම්භ වූවකි. පළාත් පාලන පුස්තකාලය සේවාවේ අභිවෘද්ධිය ප්‍රාර්ථනා කිරීම මූලික කර ගෙන බදුල්ල සෙනරත් පරණවිතාන පුස්තකාලයේ දී මංගල සභාවාරය පැවැත්වීය. ඒ සඳහා පළාත් පාලන පුස්තකාලය සේවාවේ පුස්තකාලයාධිපතිවරු හා පුස්තකාල සහායකවරු 25ක් සහභාගි වූ බව මංගල සභාවාරයේ වාර්තාවෙහි සඳහන් වේ. ඒ අනුව ආරම්භ සාමාජිකයන් ගණන 25කි. කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තීය සමිති ආඥා පනතෙහි අංක 5084 යටතේ ලියාපදිංචි කර ඇති නෛතික රාමුවක් සහිත වෘත්තීය සමිතියක් වශයෙන් හැඳින්විය හැකිය. පක්ෂ භේදයකින් තොරව පුස්තකාලය ක්ෂේත්‍රයේ සෑම මට්ටමක සේවකයන්ගේ වෘත්තීය අභිවෘද්ධිය අත්පත් කර ගැනීම මේ සංගමයේ මූලික අරමුණ වූ බව ආරම්භක සාමාජිකයෝ පවසති.

අසූව දශකයේ ඌව පළාත් පාලන පුස්තකාලය සේවාවෙහි බදුල්ල නගර සභා පුස්තකාලයෙහි සේවයෙහි නියුක්ත වූ ආර්.එම්. ගුණසේකර මහතා ප්‍රථම සභාපති වශයෙන් ද, බණ්ඩාරවෙල නගර සභා පුස්තකාලයෙහි සේවයෙහි නියුක්ත වූ ඩබ්ලිව්.ඇම්. කරුණාතිලක බණ්ඩාර මහතා ප්‍රධාන ලේකම් වශයෙන් ද තේරීපත් වූ බව සඳහන් වේ. ඒ.ඇම්. ගුණපාල, ආර්.ඇම්. චන්ද්‍රපාල ආර්.පී.එස්.සී. කරුණාසේන යන මහත්වරු ද මෙහි ආරම්භක සාමාජිකයෝ වූහ.

දීපව්‍යාප්තව කටයුතු කිරීමේ අවශ්‍යතාව විවිධ වෘත්තීයමය කටයුතුවල දී ඉස්මතු වූ හෙයින් එක්සත් මහජන පුස්තකාලය සංගමය නම් වූ නාමය වර්ෂ 1989 දී **සමස්ත ලංකා එක්සත් මහජන පුස්තකාලය සංගමය** වශයෙන් සංශෝධනය කර ඇත. පළාත් සභා ක්‍රමය මෙරට ක්‍රියාත්මකවීමත් සමඟ එක් එක් පළාත් සභාවල පළාත් පාලන විෂයට අදාළ ව කටයුතු කිරීමේ අවශ්‍යතාව නිසා දිවයින පුරා ක්‍රියාත්මකවීමට මෙසේ නම සංශෝධනය කර ගැනීම අවශ්‍ය විය. සමස්ත ලංකා එක්සත් මහජන පුස්තකාලය සංගමය මව් සංගමය වශයෙන් කටයුතු කරමින්

පළාත් නවය සඳහා ම වෙන වෙන ම ශාඛා සංගම් ආරම්භ කර ඇත. මෙම සංගමයේ සාමාජිකයන් විශ්‍රාම යාම හේතුවෙන් ක්‍රමයෙන් අක්‍රීය වූ සමස්ත ලංකා එක්සත් මහජන පුස්තකාලය සංගමය 2010 දී අවසාන මහ සභා රැස්වීම මොරටුව මහජන පුස්තකාලයේ පවත්වා ඇත.

### 3.6. කාර්මික අධ්‍යාපන පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමය

වර්ෂ 1893 සිට කාර්මික අධ්‍යාපනය මෙරට ආරම්භ විය. කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණුවට අදාළ ආයතන කීපයක් මෙරට ක්‍රියාත්මක වේ. ඒ අතරෙන් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය හා මානව සම්පත් සංවර්ධන සභාව වැනි ආයතන වර්තමානයේ නිපුණතා සංවර්ධන අමාත්‍යංශයේ යටතේ පවතී. මේ සෑම ආයතනයකම ඇති පුස්තකාලයවල කාර්යමණ්ඩලවල විවිධ වෘත්තීය ගැටලු නිරාකකරණය කර ගැනීමේ අරමුණෙන් වර්ෂ 1985 දී කාර්මික අධ්‍යාපන පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමය පිහිටුවා ගෙන ඇත.

1980-1989 කාලයේ උසස් අධ්‍යාපන ඇමති වශයෙන් ජේ.ආර්. ජයවර්ධන මහතා කටයුතු කරන කාලයේ දී කාර්මික අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පුස්තකාලයාධිපතිවරුන් විසින් මෙම සංගමය ආරම්භ කර ඇත. ආසියානු සංවර්ධන බැංකුව, එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල හා ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන ආයතනය විසින් ලබා දෙන ලද මූල්‍ය අනුග්‍රහය මත කාර්මික සංවර්ධන ව්‍යාපෘතියක් වර්ෂ 1983 දී ආරම්භ කර ඇත. මෙරට කාර්මික අධ්‍යාපන කටයුතු වැඩි දියුණු කිරීම සඳහා ඉන් අනගි මෙහෙයක් විය. පහත සඳහන් අය එහි නිලධාරීන් ලෙස පත් වූහ.

| | |
|---|---|
| සභාපති | වී.ඒ. රංගල මහතා |
| සමලේකම්වරු | ඩී.ජී.එස්. දොඩාවත්ත මහතා හා අයි.පී. ජිනදාස මහතා |
| භාණ්ඩාගාරික | ඒ.ඒ. විජේරත්න මහතා |

කමිටු සාමාජිකයන් 7ක් තෝරාපත් කර ගෙන ඇත. වෘත්තීය සමිති ආඥා පනතේ අංක 4952

යටතේ ලියාපදිංචි කර ඇති සංගමයකි.

### 3.7. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය පුස්තකාල සහකාර නිලධාරින්ගේ සංගමය

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයවල සේවය කරන පුස්තකාල සහකාරවරුන්ගේ වෘත්තීය සංගමය වශයෙන් "විශ්වවිද්‍යාලයීය පුස්තකාල සහකාර

නිලධාරින්ගේ සංගමය” හැඳින්විය හැකිය. වර්ෂ එක්දහස් නවසිය අනූදෙකේ දෙසැම්බර් මස නව වන දින (1992.12.09) කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ දී මේ සංගමයේ සමාරම්භය සිදු වී ඇත. ආරම්භ සාමාජික ගණන 56කි. කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තීය සමිති ආඥා පනතෙහි අංක 5676 යටතේ ලියාපදිංචි කර ඇති නෛතික රාමුවක් සහිත වෘත්තීය සමිතියක් වශයෙන් හැඳින්විය හැකිය. පවතින කිසිදු දේශපාලන පක්ෂයකට සම්බන්ධ නො වී ස්වාධීනව විවිධ වෘත්තීය අරගල කිරීම මේ සංගමයෙහි විශේෂත්වයකි.

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය පුස්තකාල සහකාර නිලධාරින්ගේ සංගමයේ අරමුණුවලින් කීපයක් නම්,

(අ). සේව්‍ය සේවක දෙපාර්ශවයේ සබඳතා විධිමත් කිරීම.

(ආ). පුස්තකාලය ක්ෂේත්‍රයේ සමස්ත වෘත්තීය ගැටලු සඳහා සාධාරණ විසඳුම් සෙවීම.

(ඇ). සාමාජිකයන්ගේ සුබසාධනයට හිතකර කටයුතු හැකි උපරිමයෙන් ඉටුකිරීම ආදී වශයෙන් ඉතා කෙටියෙන් සඳහන් කළ හැකිය. ශ්‍රී ලංකාවේ සියලු ම ජාතික විශ්වවිද්‍යාලවල සේවය කරන පුස්තකාල සහකාරවරුන්ට මෙහි සාමාජිකත්වය ලබාගත හැකිය.

1993 මාර්තු මස 24 වන දින වෘත්තීය සමිති ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි අනුක්‍රමික අංක 95 යටතේ වර්ෂ එක්දහස් නවසිය අනූදෙකේ දෙසැම්බර් මස නව වන දින තෝරාපත්කර ගත් ප්‍රථම නිලධාරි මණ්ඩලයේ නම් පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| සභාපති | සී.ඇස්. රාජපක්ෂ මහතා | විවෘත විශ්වවිද්‍යාලය |
| ලේකම් | ඒ.ආර්.ජී.ඩබ්ලිව්. සිල්වා මහතා | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| සහා. ලේකම් | ගාමිණි ප්‍රනාන්දු මහතා | කොළඹ විශ්වවිද්‍යාලය |
| උප සභාපති | යූ.ඒ. පියසේන මහතා | රුහුණු විශ්වවිද්‍යාල |
| භාණ්ඩාගාරික | ඒ.ජී.එච්. මුතුමිණිතිලක මහතා | කොළඹ විශ්වවිද්‍යාලය |
| ගණන් පරීක්ෂක | බෙනට් විජේතුංග මහතා | කොළඹ විශ්වවිද්‍යාලය |

කාරක සභිකයන් 9ක් තෝරාපත්කර ගන්නා ලදි. එවක කාරක සභිකයන් වශයෙන් කටයුතු කරන ලද නිලධාරීන්ගේ නම් මෙසේ සඳහන් කරනුයේ ඔවුන් මේ සංගමය වෙනුවෙන් කරන ලද සේවාවට උපහාරයක් වශයෙනි.

| | |
|---|---|
| එච්.ආර්.ඩී.පී. විමලරත්න මහතා | පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| එම්.එම්.එච්.කේ.එස්. තුන්දෙණිය මිය | පේරාදෙණිය විශ්වවිද්‍යාලය |

| | |
|---|---|
| අනිල් ජයවර්ධන මහතා | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| බී.කිව්. දංගල්ල මහතා | කොළඹ විශ්වවිද්‍යාලය |
| කේ.ඩී. ජයනායක මහතා | කැලණිය විශ්වවිද්‍යාලය |
| ආනන්ද ජයසිංහ මහතා | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| එස්. කොඩිකාර මිය | රුහුණු විශ්වවිද්‍යාලය |
| රුවිනා ද අල්විස් මිය | මොරටුව විශ්වවිද්‍යාලය |
| ශිරාන් පෙරේරා මහතා | කොළඹ විශ්වවිද්‍යාලය |

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය පුස්තකාල සහකාර නිලධාරින්ගේ සංගමයේ නිලධාරි මණ්ඩලය සඳහා සභාපති, උපසභාපති, ලේකම්, උපලේකම්, භාණ්ඩාගාරික, ගිණුම් පරීක්ෂක යන තනතුරු සඳහාත්, නීති උපදේශක තනතුරු දෙක සඳහාත්, ප්‍රධාන සංස්කාරක තනතුර හා සියලු ම ජාතික විශ්වවිද්‍යාල නියෝජනය වන පරිදි කාරක සභාව සඳහාත් සාමාජිකයන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් වාර්ෂික සමුළුවේ දී නිලධාරි මණ්ඩලය තෝරාපත් කර ගනු ලැබේ. එක් තනතුරක් සඳහා නම් කීපයක් යෝජනා ස්ථිර වූ විට බහුතර කැමැත්ත ලබා ගැනීම සඳහා ඡන්දය විමසනු ලබයි. 2012 වර්ෂය වන විට ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය හැර සියලු ම ජාතික විශ්වවිද්‍යාල පුස්තකාල සහකාරවරුන් 320ක් පමණ සාමාජිකත්වය ලබා ඇත.

සෑම වර්ෂයකම පෙබරවාරි මාසය ගිණුම් පියවීමේ ගිණුම් වර්ෂය වන අතර ජූනි හෝ ජූලි මාසවල වාර්ෂික මහ සභාව පැවැත්වේ. පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ සාහිත්‍ය ප්‍රවර්ධනය සඳහා මෙම සංගමය වාර්ෂිකව "විපුනිස" සඟරාව ප්‍රකාශයට පත්කිරීම ද ඉතා වැදගත් ශාස්ත්‍රීය සේවාවකි. සංගමය සඳහා නිල සලකුණක් මෙන් ම සංගම් ගීතයක් ද නිර්මාණය කර තිබීම ප්‍රසංසාර්හ ය. 2012 වර්ෂයේ දී 20 වන සංවත්සරය සැමරීමට හැකි වූ බව ද විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

වර්ෂ එක්දහස් නවසිය අනුදෙකේ දෙසැම්බර් මස නව වන දින සිට 2013 වර්ෂය දක්වා මෙම සංගමයේ සංවර්ධනය වෙනුවෙන් සුවිශේෂී දායකත්වයක් දක් වූ කීපදෙනකු පිළිබඳ ව සංගමයේ සාමාජිකත්වය නිරන්තරයෙන් සිහිපත් කරනු ලබයි. සී.ඇස්. රාජපක්‍ෂ, ඒ.ආර්.ජී. ඩබ්ලිව්. සිල්වා, අනිල් ජයවර්ධන, කේ.ඩී. ජයනායක, ඒ.ජී.එච්. මුතුමිණිතිලක, එම්.එස්. වල්පිට, යූ.ආර්. සුමතිපාල, චමල් අබේගුණසේකර යන අයගේ නම් ඒ අතර කැපී පෙනේ.

## 4. පුස්තකාල සේවාව සංවර්ධනය වෙනුවෙන් වගවීම හා වගකීම

ශ්‍රී ලංකාවේ පුස්තකාලය සේවයේ සංවර්ධනයට පහත සඳහන් පාර්ශවයන් වගවීම හා වගකීම වෙනුවෙන් පෙනී සිටිය හැකිය. මේ සඳහා කළ යුතු කාර්යය පැහැදිලි ව හඳුනා ගෙන ඒ සඳහා අවශ්‍ය පියවර ගත යුතුය.

(අ). පුස්තකාලයාධිපති ඇතුළු සමස්ත කාර්යමණ්ඩලය

පුස්තකාලයාධිපති ඇතුළු සමස්ත කාර්යමණ්ඩලය පුස්තකාලය සේවා සංවර්ධනය වෙනුවෙන් ප්‍රධාන වගකීම දැරිය යුතුය. මේ සඳහා වගකිවයුතු ප්‍රධාන නිලධාරියා පුස්තකාලයාධිපති වන අතර, සමස්ත කාර්යමණ්ඩලය තම වගකීම් අවබෝධ කරගෙන, එය තමන් සතු උරුමයක් බවට පත්කර ගතයුතුය. එසේ හෙයින්, එම වගකීම ඉටුකිරීමට මෙම පිරිස බැඳී සිටින හෙයින් එහි වගවීම ද දැරිය යුතුය. කාර්ය මණ්ඩලය ද කණ්ඩායමක් වශයෙන් සමඟිදමින් බැඳී, කණ්ඩායම් හැඟීමෙන් හා සහයෝගයෙන් ක්‍රියාකළ යුතුය. පාඨක පහසුව සැලසීම, කාර්යමණ්ඩලයේ පහසුව අතික්‍රමණය වන විශේෂයෙන් සැලකිය යුතුය.

(ආ). මහජන පුස්තකාලයක ප්‍රජාව (පාඨක, ශිෂ්‍ය හා අනුග්‍රාහක පිරිස)

(ඇ). පුස්තකාලය ක්ෂේත්‍රයේ ප්‍රවීණ විද්වත් වෘත්තික ප්‍රජාව (ගුරු, උපදේශක හා විෂය විශේෂඥයෝ)

(ඈ). රජය (මධ්‍යම රජය, පළාත් සභා, අමාත්‍යංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල හා රාජ්‍ය ආයතන)

(ඉ). සංවිධාන (දේශීය, විදේශීය, වෘත්තික, වෘත්තීය හා අධ්‍යාපන)

(ඊ). ජනමාධ්‍ය ආයතන

(උ). රාජ්‍ය නොවන සංවිධාන (ආසියා පදනම, ශ්‍රී ලංකා පදනම් ආයතනය)

ශ්‍රී ලංකාවේ පුස්තකාලය වෘත්තිය සංවර්ධනයේ දී නිසි බලධාරි ආයතන විසින් පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම කාලෝචිත යි මෙහි දී ශ්‍රී ලංකා පුස්තකාලය සංගමය හා ජාතික පුස්තකාලය හා ප්‍රලේඛන සේවා මණ්ඩලය භාවිතයෙන් තම වගකීම් හා යුතුකම් ඉටු කිරීමට පෙරමුණ ගැනීම මෙම වෘත්තිය නඟා සිටුවීමට උපකාරී වනු ඇත.

- වෘත්තීය ආරක්ෂා කරගැනීම සඳහා නියම වෘත්තීය සංගමයක් ආරම්භ කිරීම.
- සටන්කාමී තරුණ වෘත්තිකයන් පිරිසක් එක් අරමුණක් වෙනුවෙන් ඒකාබද්ධව කටයුතු කිරීම.
- නව සමාජ ප්‍රවණතාවන්ට පුස්තකාලය වෘත්තිය හුරු කිරීම.

- ආචාර ධර්ම පද්ධතියකට පුස්තකාලය වෘත්තිය අනුගත කිරීම.
- රාජ්‍ය සේවයේ වෙනත් සමාන්තර සේවාවන්හි මෙන් කුසලතාව මත හෝ උසස් අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් මත හෝ උසස්වීම් ලබා ගැනීමේ ක්‍රමයක් ඇති කිරීම.
- යහපත් අනුප්‍රාප්තිකයන් පිරිසක් නිර්මාණය කරගැනීම.
- පුස්තකාලය හා විඥාපන විද්‍යාව පාසල් විෂයයක් බවට පත්කිරීම.
- පුස්තකාලය හා විඥාපන විද්‍යා අධ්‍යාපනයේ දුර්වලතා හඳුනා ගෙන විෂයමාලා යාවත්කාලීන කිරීම.
- පුස්තකාලය ප්‍රමිති නිවැරදිව සකස් කිරීම හා පවත්වා ගෙන යාම.

ශ්‍රී ලංකාවේ පුස්තකාලය සේවය වර්තමානයේ පත් වී ඇති තත්ත්වය කටුක ය. ඛේදජනක ය. වෘත්තියේ අස්ථාවරත්වය, සමාජ පිළිගැනීමේ අඩුලුහුඩුකම්, රජයේ අල්ප අනුග්‍රහය, තනතුරු කප්පාදුව, වෘත්තීය වර්ගීකරණයේ පහත වැටීම, පරිපාලන අංශයෙන් මඳ සැලකිල්ල, සංවර්ධනාත්මක ආකල්පවලින් තොරවීම, අධ්‍යයන අනධ්‍යයන කඹ ඇදීම හා බඳවාගැනීමේ ප්‍රතිපත්තිවල ව්‍යාකුල බව ආදී වශයෙන් පුස්තකාලය සේවයේ හා පුස්තකාලයාධිපතිත්වයේ විද්‍යමාන සංකුලතා විමසිල්ලට හා සම්පරීක්ෂණයට බඳුන් කළ යුතුය.

## *ආශ්‍රිත ග්‍රන්ථ*

කොරයා, ඊශ්වරී (1969), 'පුස්තකාල, ලංකාවේ අධ්‍යාපනය' : (ක්‍රි. පූ. ස වැනි සියවසේ සිට අද දක්වා), සියවස ප්‍රකාශනය, III කාණ්ඩය, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය, කොළඹ, පි. 1181

පියදාස, ටී.ජී. (1985), 'ශ්‍රී ලංකාවේ පුස්තකාල වෘත්තිය පිළිබඳ මතක සටහන්' පුස්තකාල ප්‍රවෘත්ති : ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය, ජූලි - දෙසැ. 6 (3/4), පි. 5-8

ලංකාගේ, ජයසිරි (1975), 'ශ්‍රී ලංකා පුස්තකාල සංගමය' පුස්තකාලය හා ජනතාව. මහජන පුස්තකාලය, කොළඹ පි. 67-74

ලංකාගේ, ජයසිරි (1980), 'ශ්‍රී ලංකාවේ පුස්තකාල ව්‍යාපාරය' නුවණට මං. මහජන පුස්තකාලය, කොළඹ, පි. 23-32

තිස්ස, ආර්. ඩී. ආනන්ද (2012), 'මහාචාර්ය ජයසිරි ලංකාගේ මහතා සමඟ මහාචාර්ය පියදාස රණසිංහ මහතා පැවැත් වූ පිළිසඳර' මහාචාර්ය ජයසිරිලංකාගේ අභිනන්දන ග්‍රන්ථය, සංස්. මහාචාර්ය පියදාස රණසිංහ හා ආර්.ඩී. ආනන්ද තිස්ස, ඇස්. ගොඩගේ, කොළඹ, පි. 113

**The new Encyclopaedia Britannica** (1985), Encyclopaedia Britannica Incorporated, Chicago, vol. 4, P.53

## වෙනත් ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය

බස්නාහිර පළාතේ පළාත් පාලන පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමය ප්‍රථම වාර්ෂික සම්මේලන වාර්තාව, 1998

රණසිංහ, ආර්.එච්.අයි.එස්. (2001/2002), ශ්‍රී ලංකා පුස්තකාල සංගමය : ක්‍රියාකාරිත්වය සහ ශ්‍රී ලංකාවේ පුස්තකාල සේවාවේ වර්ධනයට සපයන දායකත්වය පිළිබඳ විමසීමක් Sri Lanka Library Review. ජූලි/දෙසැ වෙළුම 15 අංක 2 හා ජනවාරි/ජූනි වෙළුම 16 අංක 1

ශ්‍රී ලංකාව. 1970, 1970 අංක 17 දරන ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පනත, ලංකා ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ශ්‍රී ලංකාව. 1974, 1974 අංක 20 දරන ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (සංස්ථාගත කිරීමේ) පනත, ලංකා ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ශ්‍රී ලංකාව. 2004, 2004 අංක 07 දරන ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (සංස්ථා ගත කිරීමේ) (සංශෝධන) පනත, ලංකා ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය පුස්තකාල සහකාර නිලධාරින්ගේ සංගමය වෘත්තීය සමිති ලියාපදිංචි කිරීමේ සහතිකය 'ඩී' පෝරමය

### උපැදි අංක 01

| | |
|---|---|
| සොලමන් සිසිල් බ්ලොක් මහතා | 1960 - 1965 |
| කේ.ඩී. සෝමදාස මහතා | 1966 - 1967 |
| ඊශ්වරි කොරයා මහත්මිය | 1967 - 1968 |
| විජේරත්න බණ්ඩාර දොරකුඹුර මහතා | 1969<br>පෙබරවාරි - දෙසැම්බර් |
| තිරුප්පුවසම් ගාල්ලගේ පියදාස මහතා | 1970 - 1973 |
| විජේරත්න බණ්ඩාර දොරකුඹුර මහතා | 1973 - 1974 |
| එගොඩගේ දොන් තිලකපාල කුලරත්න මහතා | 1975 - 1979 |
| ෆීලික්ස් සමරරත්න මහතා | 1979 - 1982 |
| මහාචාර්ය විජේරත්න බණ්ඩාර දොරකුඹුර මහතා | 1982 - 1988 |
| ක්ලෝඩා නෙත්සිංහ මහත්මිය | 1988 - 1991 |
| එස්.එම්. කමල්ඩීන් මහතා | 1991 - 1992 |
| මහාචාර්ය ජයසිරි ලංකාගේ මහතා | 1992 - 1993 |
| නීල් උපාලි යාපා මහතා | 1993 - 1995 |
| පියදාස විද්‍යානපතිරණ මහතා | 1995 - 1997 |
| හැරිසන් පෙරේරා මහතා | 1997 - 1999 |

| | |
|---|---|
| සුමනා ජයසූරිය මහත්මිය | 1999 - 2000 |
| දයා රත්නායක මහත්මිය | 2000 - 2002 |
| නීල් උපාලි යාපා මහතා | 2002 - 2004 |
| දීපාලි තලගල මහත්මිය | 2004 - 2006 |
| දිල්මිනි වර්ණසූරිය මහත්මිය | 2006 - 2007 |
| මහාචාර්ය පියදාස රණසිංහ මහතා | 2007 - 2009 |
| පුංචිබණ්ඩා ගල්ලබ මහතා | 2009 ජූනි - නොවැම්බර් |
| උපාලි අමරසිරි මහතා | 2009 - 2012 |
| ඩොලිතා අන්ද්‍රාදි මහත්මිය | 2012 - 2014 |
| ශිවන්ති වීරසිංහ මහත්මිය | 2014 |




## ආර්.ඩී. ආනන්ද තිස්ස

ගෞරව ශාස්ත්‍රවේදී, සමාජීය විද්‍යාපති (කැලණිය විශ්වවිද්‍යාලය), ලේඛකත්ව හා සන්නිවේදන පශ්චාත් උපාධි ඩිප්ලෝමා (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය), ඒ.එස්.එල්. එල්. ඒ. (ශ්‍රී ලංකා පුස්තකාල සංගමය), ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල.

# A Bibliometric Study of Postgraduate Theses Presented to the Institute of Indigenous Medicine, University of Colombo - During the Time Period 1995 – 2010

C. K. Gamage

**Abstract** :

*Bibliometric is a type of research method used by the researchers in different disciplines to analyze quantitatively scientific and technological literature. The main objective of this study is to find out the bibliometric features and analyze the bibliometric techniques used by Ayurvedic and Unani medical practitioners for their postgraduate theses. This study is based on survey method and utilizing the title page and bibliography of the postgraduate theses done by Ayurvedic and Unani medical practitioners, during the time period of fifteen years. According to that a total number of 87 theses were utilized during the selected period, available at the Institute of Indigenous Medicine. Among them there are eighty (80) theses have done in locally and seven (7) theses have been done internationally. From these 87 theses a total number of 5165 citations were extracted. These citations have originated from different types of materials such as books, periodicals, theses and web resources etc. Out of these reference materials books were the heavily used reference material and periodicals were the secondly used source. Most of the reference materials used by the researchers were mostly limited to the printed materials and gradually the preference of usage of non print materials were increased.*

*The most important finding of this research has emerged the research preferences of Ayurvedic and Unani medical practitioners. According to that point of view, highest number of Ayurvedic medical practitioners have done researches related to the field of Nidana Chikitsa. On the other hand, highest research preference of Unani medical practitioners have to gone on the field of Moalijath.*

*The facts reveled by this study highlights the various priorities and will shed light on the future research targets of the researchers, the identification of the areas that should be developed in Ayurvedic and Unani systems of medicine, the bibliometric techniques should be used for relevant information dissemination and up lift of the both Ayurvedic and Unani medical systems.*

***Keywords :***

*Bibliometrics, Bibliometric research, Ayurveda medicine, Unani medicine, Information Dissemination*

## Introduction

Bibliometrics is a type of research method used by the researchers to quantitatively analyze scientific and technological literature in different disciplines. While bibliometric methods are most often used in the field of library and information science, bibliometrics have wide applications in other areas, too. Bibliometric studies are utmost important as an evaluation technique in the field of library and information science. Librarians have to get correct decisions when selecting library materials, developing collection management policies and withdrawal policies of unused reference materials, accepting donations, avoiding collecting unnecessary materials and also arranging the library collection relevant to the future information needs etc. Bibliometric study can be introduced as a proper mechanism to solve these problems which are faced by librarians in an effective and efficient manner. At present bibliometric techniques are included in the field of library and information science, Librametrics, Bibliometrics, Scientrometrics and Informatrics.

The Institute of Indigenous Medicine, University of Colombo is the premier higher education institute of indigenous medicine in Sri Lanka. It is a compulsory requirement to submit a thesis or dissertation as a partial fulfillment of the postgraduate Degree. In this manner a large number of postgraduate theses are produced annually, by every university. Researchers used various types of reference materials to produce a good research. Books, journals,

ola leaf manuscripts, hand written manuscripts, CD ROMs, data bases and web sites are some of them. It is very effective to do a bibliometric study to search about what type of reference materials were used by the researchers, in which format they prefer, weather the available resources are enough or not, and the pattern of information seeking behavior etc. Therefore bibliometric study is quantitative in nature and this technique can be effectively used to arrange the library materials to meet the user needs.

## History of Bibliometrics

The first bibliometric study was done by Cole and Eale in 1917 called "The History of Comparative Anatomy Part 1: A Statistical Analysis". Then in 1923, Hulm has done a study using journal entries of international catalogue of scientific literature. The term 'bibliometric' was firstly used by Alan Pritchard in 1969 in an article titled 'Statistical Bibliography or Bibliometrics' to denote a new discipline where quantitative methods were employed to probe scientific communication process by measuring and analyzing various aspects of written documents.

There are three different types of bibliometrics - Literature Bibliometrics, Patent Bibliometrics and Linkage Bibliometrics are heavily used among others. Literature bibliometric indicators are counts of publications and citations in scientific literature as cross – sectional citation, co authorship and concentration within core journals. Bibliometric studies originated with the necessity of analyzing written documents of various disciplines.

### Definitions

Many researchers define the term bibliometrics with different view points. The word 'bibliometrics' consisted of two Latin and Greek words 'biblio' and 'metrics' meaning a book and 'metricus' or 'metrikos' respectively.

"Organization, classification and quantitative evaluation of publication patterns of all macro and micro communications along with their authorship by mathematical and statistical calculus"

–***Sen Gupta*** *(1990)*

"The use of documents and patterns of publication in which mathematical and statistical methods have been applied."

- **The British Standard Glossary of Documentation of Terms** (1976)

"The study and measurement of the publication patterns of all forms of written communication and their authorship."

***- Potter*** *(1998)*

## Bibliometric Laws

Researchers carried out bibliometric studies in various disciplines in order to identify bibliometric features. A number of bibliometric laws have been introduced for this purpose. Out of several bibliometric laws there are three prominent laws, namely, **Zipf's law about the frequency of occurrence of words in a text, Bradford law of scattering of articles and Lotka's inverse square law of scientific productivity.**

Lotka, A.J. (1926) has presented a theoretical base for bibliometric studies including authorship. Hence, Lotka's Law basically describes the frequency of publication by authors in a given field. Bradford law (1934) is also introduced as the 'Scattering Law' and it can be used to express the article productivity of journals. Zipf has presented this law in 1949 and it is often used to predict the frequency of words within a text. These three bibliometric laws are the pillars of Bibliometrics, Scientometrics and Informetrics.

## Literature Review

A large number of bibliometric research studies in different disciplines are conducted at local as well as international level. But in Sri Lanka only a limited number of bibliometric studies have done in the field of library and information science.

Bibliometric studies are quite new to the field of library and information research in Sri Lanka when compared to those of other countries. Bibliometric is the study of quantitative dimensions of scholarship. And also it is the study of the use of documents and

their pattern of publications in which mathematical and statistical methods have been applied. Weerakoon has done "***A Bibliometric Study of the Journal of the National Science Foundation of Sri Lanka during 2004 – 2013."*** The main objective of this research is to study the bibliometric measures of the articles published in the journal of National Science Foundation of Sri Lanka during the time period of 2004-2013. Under this objective the author has done an analysis under three principal domains Article analysis, author analysis and the citation analysis. This research highlights several features of single journal studies, their publication patterns, article characters, author characteristics, active researchers, active institutions, popular research journal fields and the influence of the scientific community.

Maheshwaran (2005) has done a research on "***Bibliometric Phenomenon of Tamil Publications in Sri Lanka in 2005"*** The main objective of this research is to evaluate the usefulness of bibliometric application for analysis of Sri Lankan Tamil publications. For that the researcher selected only one year period of time of 2005. And also he selected a total number of 65 authors who have produced 77 Tamil publications. As per the analyzed data it is proved that 40% of publications were published in Colombo. The contribution of Jaffna and Batticalo scored gradually in 11% and 9%. 15% of publications with a Muslim origin were published in the Eastern province while 16% of the Tamil publications were published in the upcountry.

Dasanayake (2009) has conducted a research on "***Bibliometric study of Sociology***" in the National Institute of Library and Information Science, Sri Lanka. The main objective of this research was to identify the publication patterns in the field of sociology. The Author selected hundred publications which were published in Sinhala medium during the time period of 1959 – 2009. According to the findings of this research, it was proved that most of sociological publications during this time period were theses have been produced by lecturers for their postgraduate Degrees.

Gunasekara (2008) has completed a research on "***Library and Information Science Research Literature in Sri Lanka: A Bibliometric***

***Study***” The researcher has selected two journals related to the field of Library and Information Science, named Journal of the University Librarians Association of Sri Lanka and Sri Lanka Library Review. The study were examined 141 articles published during the period from 1997 to 2007. The aim of this research was to identify the characteristics of Library and Information Science literature in Sri Lanka. The research has highlighted that a large number of research articles which were published in the above mentioned two journals during this period mainly concentrated on the two main areas of library and information science activities and information seeking.

“***A Bibliometric Study of renown Novels Translated into Sinhala : (2001 – 2010***) was based on universally recognized novels of American, Russian, Indian, African and English literature. To identify the language differentiations of translated novels, To analyze translated novels by using the bibliographic descriptions i.e. authors, translators, publishers, pages and prices and also to explore the favourations of users etc. are some of the objectives of this study. Alahakoon (2013) used the National Bibliography as the main data source and he analyzed a total number of 823 translated novels during the selected time period of 2001 – 2010. According to the findings of this study, the year in which 2010 is the year translated highest number of books and the least number of books translated in the year of 2002. The majority of books were translated into Sinhala related to the English literature and American and Russian literatures followed by. R.K.Narayan, the author of Indian origin, who authored the books in English that are held in high esteem by the readers of selected decade.

## Statement of the Problem

The Institute of Indigenous Medicine library has various kinds of information resources in different formats. These information resources are acquired based on the recommendations of Heads of the Departments of relevant departments. This research study is an attempt to check the relevancy and utilization of these resources used for the compilation of postgraduate theses in the two fields of Ayurvedic and Unani medicine.

## Objectives of the Study

Main Objective of this study was **t**o investigate the bibliometric features of postgraduate theses in the fields of Ayurvedic and Unani medicine available at the Institute of Indigenous Medicinal library during the period 1995-2010.

The study specifically aimed (a) to explore the department vise distribution of theses in order to understand the direction of Ayurvedic and Unani research, (b) to identify the heavily used books in the fields of Ayurvedic and Unani medicine, (c) to determine authorship pattern of cited documents, (d) to identify core journals used in postgraduate researches in the two relevant medical fields and (e) to explore the number of citations and its distribution by format of publications.

## Methodology

This study is based on the survey method and bibliometric techniques are used as the research method.

## Data Collection –

For the purpose of data collection, title pages and bibliographies of postgraduate theses were extensively used to collect relevant data for this study.

According to this, the total number of theses selected were 87 out of 118. Within this period of time from 1995 to 2010 the Institute of Indigenous Medicine, produced 87 theses. Therefore only these 87 theses are used to extract relevant data for this research, and selected bibliographies of these 87 theses available at the library of Institute of the Indigenous Medicine, University of Colombo, covering the fields of Ayurvedic and Unani medicine. These theses were divided into two categories based on the two sections of the institute. According to that, 76 theses are related to Ayurvedic medicine and 11 theses are related to the Unani medicine.

## Methods of Analysis

All data was fed into the excel worksheet and tabulate and cross tabulate all information which was collected from bibliographies

of 87 postgraduate theses. The total number of 5165 citations were analyzed to identify the core reference materials in the fields of Ayurvedic and Unani medicine.

## Results and Discussion

## Categorization of Theses

As stated earlier this study examined submitted to the Institute between 1995 to 2010. These theses can be categorized according to several sub themes, like geographical boundaries, languages, nature of postgraduate Degrees, sections and department vise etc.

- **According to the Geographical Boundaries**

When considering the geographical boundaries of theses, they can be divided into two parts, theses done locally and theses done internationally. According to that category the number of theses done locally is 80 and handed over to the Institute of Indigenous Medicine, University of Colombo. The number of theses done internationally is 07 and handed over to the Benaras Hindu University - Varanasi, Gujarat Ayurvedic University – Jamnagar, National Institute of Ayurvedic Medicine, Rajasthan University- Jaipur, University of Hamdard – Delhi, Nizamiya Tibbi College - Hydrabad, National Institute of Unani Medicine- Rajive Gandhi University in India.

- **According to the Language-**

Two languages, Sinhala and English were used by researchers for their researches. Among the 87 theses 54 theses were written in English language and 33 theses were written in Sinhala language.

- **According to the Postgraduate Degrees**

Researchers who were involved in researches in the fields of Ayurvedic and Unani medical fields followed several Degree courses and a total number of 87 theses can be categorized according to the Degree vise like, Degree of Master of Philosophy (Ayurveda) 69 theses, Degree of Master of Philosophy (Unani) 10 theses, Degree of Doctor of Medicine (Ayurveda) 07 theses, Degree of Doctor of

Medicine (Unani) 01 thesis and Degree of Doctor of Philosophy (Ayurveda) also only o1 thesis are among them.

**Graph 1 – Distribution of M.phil Theses**

- **According to the Sections/ Departments**

The academic section of Institute of Indigenous Medicine is basically divided into two main parts such as Ayurvedic section and Unani section. And also the section of Ayurveda is again divided into eight departments and the section of Unani divided into two.

According to this category the section of Ayurveda has received 76 theses of 87 in number and their's department vise distribution are as follows. Dept. of Basic Principles 08 theses, Dept. of DravyaGuna Vignana received 13 theses, Dept. of Nidana Chikitsa 18 theses, Dept. of Deshiya Chikitsa10 theses, Dept. of Prasuthi Thantra 11 theses, Dept. of Shareera Vignana 03 theses, Dept. of Shalya Shalakya received 07 theses and Dept. of Swasthavritha Agada received 06 theses.

Unani Section of Institute of Indigenous Medicine has only two departments Dept. of Moalijath ( Dept. of DravyaGuna Vignana) has received 09 theses and Dept. of Ilmul Adviya( Dept. of Basic Principles) has received theses 02 in number.

When consider the distribution of theses departments vise their's range varies from 03 to 18 in the Ayurvedic section. Department of Nidana Cikithsa scored the highest number of theses and least number of theses done by Department of Shareera Vignana. Departments of DrvyaGuna Vignana and Department of Prasuthi Tanthra scored the second and third place, 13 and 11 theses respectively.

**Graph 2 – Distribution of Theses in Department Vise**

- **Usage of Reference Materials**

User communities in academic libraries, specially in university libraries seek various kinds of information sources to achieve

their research targets. Books, Journals, Theses, Reports are some of these information sources and they are in different formats like in print, online and CDs. When considering the high demand of users for the library materials, it becomes a problem to librarians to acquire sufficient library materials to satisfy the user needs. The main reason for this condition is cost of information sources, specially journals and at the same time the annual budget of university libraries decreases year by year. Therefore selecting and acquiring the information sources which are suitable for user needs and limited budgets have given rise to priorities.

In order to identify the most used reference materials by the researchers of Ayurvedic and Unani field of medicine 5165 citations were analyzed. According to that following reference materials were used.

- Books
- Journals
- Dictionaries, Commentaries, Lexicographies and Encyclopedias
- Theses
- Web Sites
- News Papers

According to the research findings books are the most heavily used reference material than other information sources. Out of all kinds of citations, 4180 accounts of citations and approximately 81% (80.9%). It reflects that books are the most preferred reference material for the researchers of Ayurvedic and Unani fields of medicine. Second place scored by the dictionaries with accounting 238 and 4.6%. Journals got the third place in order and 3.3%. On the other hand these results proved that the single author contribution is higher than collaborative author contribution.

**Table 1 and Graph 3** - **Distribution of Reference Materials**

- **Ayurveda and Modern Core Books Used**

Books acquired the highest place of preference among reference materials used by researchers. Hence, books can be divided into two groups according to the nature of this research, as Ayurvedic core books and modern core books.

- **Ayurveda Core Books Used**

Majority of researchers in the field of Ayurvedic medicine mostly used following ten books namely, Charaka Samhitha, Susrutha Samhitha, Ashtanga Hardaya Samhitha, Bhava Prakasha, Madhva Nidhana, Sharangadhara Samhitha, Ashtanga Sangrahaya, Ayurveda Sameeksha, Yoga Rathnakaraya and Sarartha Sangrahaya as major core books in the system of Ayurveda. According to the results of this study "Charaka Samhitha" is the most used book in the field of Ayurvedic medicine. The second highest usage goes to "Susrutha Samhitha" and the third preference reference material is "Ashtanga Hardaya Samhitha".

- **Modern Core Books Used**

Researchers who are involved in research not only used Ayurveda books but also Unani medical field used modern books as comparatively. After analyzing the relevant data have been identified ten major core books such as, Davidson's Principle & Practice of Medicine(Davidson, S. & Macleod, John), Medicinal Plants Used in Ceylon (Jayaweera, D.M.A.), Indian Medicinal Plants (Kittikar, K.R.), Ayurvedic Pharmacopeia (Jayasinghe, D.M.), A Reverse Handbook of Flora in Ceylon (Dissanayaka, M.D.), Hutchison's Clinical Methods (Michael, S.), Gray's Anatomy (Davies, D.V.), Chaurasia's Handbook of General Anatomy (Chaurasia, B.D.), Clinical Methods in Ayurveda (Murthi, Sri KanthaK.R.), Ayurveda Prasuthi-Tanthra Evam Stri Roga (Tewari, P.V.). According to this ten core books, highest preference goes to the "Davidson's Principle & Practice of Medicine" and least preference goes to the book of "Ayurveda Prasuthi-Tanthra Evam Stri Roga".

- **Core Journals Identified**

Among these reference materials journals keep the record of the most latest information. Hence, most of researchers are preferred to use scholarly journal articles as citations. Among the three prominent bibliometric laws which were mentioned above, Bradford's law of scattering of articles, was used to identify five core journals in this study. Bradford law can be used effectively to define the core journals and prepare the priority list among journals used. According to that, with the help of Bradford's law analyzed journal article citations to identify five core journals out of 36 journals. They were,

- Journal of Research & Education in Indian Medicine.
- Journal of Ethnopharmacology
- Journal of Research in Ayurveda & Siddha
- Journal of Research in Indian Medicine
- Planta Medica

- **Quick Reference Materials Identified**

Researchers used quick reference materials to fulfill their various research needs. Dictionaries, Commentaries, Glossaries, Lexiocographies and Encyclopedias are included in the category of quick reference materials. The most popular quick reference materials of Ayurvedic medical field are Amarakosha, Chakrapani Datta Teekawa, ShabdhaKalpadruma, Monior Williams Dictionary, Indigenous Medical Dictionary, Sarvanga Sundara Teekawa, MadhukoshaTeekawa, DalhanaTeekawa, Saraswathei Teekawa, Wanawasa Nighandu, Dhanwanthari Nighandu etc.

Among these quick reference materials Dictionaries scored the most preference material of reference. And gradually Commentaries, Lexiocographies, and Encyclopedias used by researchers.

**Graph 4 - Distribution of Quick Reference Materials**

- **Citation Ranges Scored**

Most of researchers quoted citation range is 51 – 80. Only one researcher used the citation range of more than 200.

**Table 2 - Citation Ranges Used**

**Authorship Pattern**

- Single Author Contribution –
  The study revealed that the proportion of single author contribution is substantially higher than the collaborative author contributions.

- Identify the Language Preference
  Researchers in the latter part of the selected time period mostly used English language to write their theses. But at the beginning they preferred to use Sinhala language.

- Identify the formats of Reference Materials
  All of researchers, 87 in number preferred to use printed materials than the electronic materials.

**Conclusions and Recommendations**

This research study reveals the following bibliometric features.

Books were the most heavily used reference material in the fields of Ayurvedic and Unani medicine. According to the results "***Charaka Samhitha"*** was the most used book in the field of Ayurvedic medicine and "***Davidson's Principle & Practice of Medicine***' was scored the second place.

Single author citations is higher compared to collaborative author contribution. Study reveals that the highest preference of researchers go to printed materials than on - line materials. However, the study reveals that the usage of online resources has increased towards the end of the selected time period.

Most of the researchers scored a lesser number of citations in both medical fields when compared with the other disciplines. Only one thesis had used more than 200 citations.

According to the findings of this study, researchers did not use enough scholarly journals as reference materials. Therefore following recommendations are made to encourage and promote the researchers to strengthening the capacity and quality of their researches.

- It is recommended that use of more scholarly publications, may be caused to uplift and strengthening postgraduate researches.
- Training programmes should be provided for literature searching as a compulsory component of postgraduate courses, for making aware of the researchers about freely access e – books, e- journals and Data bases like HINARI.
- Necessity of subscription of core journals on a regular basis Upgrading research facilities to enhance research activities locally.
- Encourage researchers to publish articles in local & international Journals Bibliometric studies should be conducted more often related to the fields of Ayurvedic and Unani medicine

## References

Alahakoon, U. (2013), 'A Bibliometric Study of Renown Novels Translated into Sinhala Language', Sri Lanka National Bibliography : 50$^{th}$ Anniversary, National Library and Documentation Services Board , Colombo.

Dambavinna, K. P. K. (2012), 'Transmission and Storage of Information for high Professionals in Sri Lanka: A Bibliometric Analysis', Journal of Information Technology and Business Management, Vol. 9 (1), 13 -21.

Dasanayake, D. M. T. P. (2003), 'Bibliometric Study of Sociology', MLS Thesis. [Unpublished ], University of Colombo.

Dictionary of Library and Information Science, viewed 10. 10.2013,

[Online], URL www.wcsu.edu/library/odlis -html.

Erar, A (2002), 'Bibliometrics or Informetrics', URL http://www.mat.hacettepe.edu.tr/hjms/english/issues/vol. 131/ full text/ PP. 113-125 pdf.

Maheshwaran, R. (2007), ‘Bibliometric Phenomenon of Tamil Publications in Sri Lanka’, Journal of The University Librarians’ Association of Sri Lanka, vol. 11, 2- 36.

Weerakoon, W. R. W. M. A. U (2014),’ A Bibliometric Study of the Journal of the National Science Foundation of Sri Lanka during 2004 -2013’, MSSc thesis, [Unpublished], University of Kelaniya.




**Graph 1 – Distribution of M.phil Theses**

**Graph 1 – Distribution of M.phil Theses**




**Graph 2 – Distribution of Theses in Department Vise**

| Name of the Reference Material | Frequency | Percentage (%) |
|---|---|---|
| Books | 4180 | 80.9% |
| Journals | 172 | 3.3% |
| Theses | 130 | 2.5% |
| Dictionaries | 238 | 4.6% |
| Commentaries | 151 | 2.9% |
| Lexicographies | 81 | 1.6% |
| Encyclopedias | 61 | 1.2% |
| Web Resources | 128 | 2.5% |
| News Papers | 24 | 0.5% |
| Total | 5165 | |

**Table 1 – Distribution of Reference Materials**




**Graph 3 - Distribution of Reference Materials**




Graph 4 - Distribution of Quick Reference Materials

| Citation Rangers | Number of Theses |
|---|---|
| 20 - 50 | 30 |
| 51 - 80 | 35 |
| 81 - 110 | 5 |
| 111 - 140 | 6 |
| 141 - 170 | 4 |
| 171 - 200 | 6 |
| 200 > | 1 |
| Total | 87 |

Table 2 - Citation Rangers Used

## C. K. Gamage



BA (Hons.),University of Sri Jayawardanapura, followed the Diploma of Library and Information Science, part I and II at the University of Kelaniya, Masters Degree in Library and Information Science, University of Colombo, Senior Assistant Librarian, Institute of Indigenous Medicine, University of Colombo. Reading for PhD Degree, University of Kelaniya, The working title of her thesis is 'Organization and Transmission of Ayurvedic and Indigenous Medical Knowledge in Sri Lanka'.

# මහජන පුස්තකාල සේවාවේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ දී මානව සම්පත් කළමනාකරණයේ බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

**(උතුරු මැද පළාතේ මහජන පුස්තකාල ඇසුරෙන්)**

**උදිත අලහකෝන් සහ**
**ඩබ්ලිව්. එම්. අරවින්ද**

---

**සාරාංශය**

*ඉෆ්ලා/යුනෙස්කෝ (International Federation of Library Associations and Institutions /UNESCO) මහජන පුස්තකාල ප්‍රඥප්තියට අනුව මහජන පුස්තකාලයක අභිප්‍රාය වන්නේ දැනුම සඳහා ප්‍රාදේශීය ද්වාරයක් තිබීමත් පෞද්ගලික මෙන්ම සමාජ කණ්ඩායම්වල යාවජීව ඉගෙනුම, ස්වාධීන තීරණ ගැනීම සහ සංස්කෘතික දියුණුව සඳහා මූලික පහසුකම් සැපයීමත්ය. මෙම අභිප්‍රාය සාක්ෂාත් කර ගැනීමට මානව සම්පත් කළමනාකරණයේ විධිමත්භාවය සෘජුව බලපාන බව පැහැදිලි කරුණකි. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ උතුරු මැද පළාතේ මහජන පුස්තකාල කාර්ය මණ්ඩලවලට අදාළව මානව සම්පත් කළමනාකරණයේ විවිධ අංග ක්‍රියාත්මක වන ආකාරයත් එය පුස්තකාල සේවාවේ ගුණාත්මකභාවයට කරනු ලබන බලපෑමත් විමසුමට ලක් කිරීමය. මෙහි දී පර්යේෂණ ක්‍රමවේදය ලෙස සමීක්ෂණ ක්‍රමවේදය භාවිත කර ඇත. දත්ත රැස් කිරීමේ උපකරණ ලෙස ප්‍රශ්නාවලි සහ නාභිගත සම්මුඛ සාකච්ඡා යොදා ගැණිනි. මේ අනුව උතුරු මැද පළාතේ පළාත් පාලන ඒකක 52ක් නියෝජනය කරන පුස්තකාල කාර්ය මණ්ඩල සාමාජිකයන් 55 දෙනෙකු නියැදිය ලෙස මෙම පර්යේෂණයට යොදා ගත් අතර මෙහි දී ප්‍රධාන වශයෙන්ම අනාවරණය වූයේ උතුරු මැද පළාතේ මහජන පුස්තකාල සේවාවේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා විධිමත් මානව සම්පත් කළමනාකරණයක් නොපැවතීම ප්‍රධාන බාධකයක් ලෙස ක්‍රියාකරන බවය. එමෙන්ම මානව සම්පත් කළමනාකරණයේ ගැටලු විසඳා ගැනීමට ජාතික මට්ටමේ වෘත්තීය හා උපදේශන ආයතනවල මැදිහත් වීම ප්‍රමාණවත් නොවන බව ද අධ්‍යයනයේ දී තහවුරු විය. එහෙයින් මහජන පුස්තකාල සේවාවේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට මානව සම්පත් කළමනාකරණය විධිමත් කිරීමත්, ඒ සඳහා මධ්‍යම මෙන් ප්‍රාදේශීය දේශපාලන අධිකාරියේත්, පරිපාලන තන්ත්‍රයේත්, පුස්තකාල ක්ෂේත්‍රයේ ජාතික මට්ටමේ වෘත්තික සංවිධානවලත්, උපදේශක ආයතනවලත් අවධානය යොමු කිරීම නොපමාව සිදු විය යුතු බව මෙයින් යෝජනා කෙරේ.*

## මූලික පද

මහජන පුස්තකාල, මානව සම්පත්, පුස්තකාල අධ්‍යාපන, කළමණාකාරණය, පුස්තකාල කාර්ය මණ්ඩලය.

## හැඳින්වීම

මිනිසාගේ ජීවිතය අර්ථවත් ආකාරයට පවත්වා ගෙන යාම සඳහා තොරතුරු සහ දැනුම අත්‍යවශ්‍ය සාධකයක් බවට පත්ව ඇත. අද්‍යතන සමාජය තොරතුරු නැතහොත් දැනුම සමාජයක් ලෙස හඳුන්වන්නේ එහෙයිනි. මෙයින් අදහස් වන්නේ රටක් සමාජ, ආර්ථික, දේශපාලනික සහ සංස්කෘතික වශයෙන් සීඝ්‍ර දියුණුවක් අත්පත් කර ගැනීමට නම් එකී රටේ පුරවැසියන් බහුතරයක් තොරතුරු සහ දැනුම අර්ථසම්පන්න ලෙස භාවිත කිරිම අත්‍යවශ්‍ය බවය. දැනුම සමාජයක ප්‍රධාන ලක්ෂණ වන්නේ දැනුම නිෂ්පාදනය, බෙදාහැරිම සහ භාවිතයයි. මෙම දැනුම සීමිත පිරිසක් තුළ පමණක් සංසරණය නොවී බිම් මට්ටම දක්වා ගමන් කිරිම මෙහිදී බෙහෙවින් වැදගත් වේ. මෙම තොරතුරු සහ දැනුම බිම් මට්ටම කරා ගෙනයාමේ ක්‍රියාවලියේදී මහජන පුස්තකාලවලට සුවිශේෂි කාර්යභාරයක් හිමිවේ. විශේෂයෙන් ග්‍රාමීය කලාපවලදී මහජන පුස්තකාලයේ භූමිකාව තීරණාත්මක වේ. එලෙසම පුරවැසියන්ගේ සංස්කෘතික ජිවිතය අර්ථවත් කිරිමද මහජන පුස්තකාලයේ කාර්යයකි. එනම්, මිනිසුන්ගේ වින්දනීය අවකාශය වඩාත් පුළුල් කිරිමය. යුනෙස්කෝ මහජන පුස්තකාල ප්‍රඥප්තිය (2000) මහජන පුස්තකාලයේ අභිප්‍රාය ලෙස දක්වනුයේ (i) සියලුම මට්ටම්වල පෞද්ගලික සහ ස්වයං අධ්‍යාපනය මෙන්ම විධිමත් අධ්‍යාපනය සඳහා සහායවීම (ii) අදාළ ප්‍රදේශයේ ජනතාව සඳහා සියලු ආකාරයේ දැනුම සහ තොරතුරු සපයන ප්‍රාදේශිය මධ්‍යස්ථානයක් වීම (iii) පෞද්ගලික නිර්මාණාත්මක සංවර්ධනය සඳහා අවස්ථා සැපයීම වශයෙනි. එමෙන්ම මහජන පුස්තකාල සේවාව සංවර්ධනය සඳහා ඉෆ්ලා (The International Federation of Library Associations and Institutions /UNESCO) නියමුව (2010) පෙන්වා දෙන ආකාරයට මහජන පුස්තකාල යනු සමාජීය සහ සංස්කෘතික වශයෙන් සමාජය ධනාත්මක වෙනසකට යොමුකරන ආයතනයකි.

මෙම පුළුල් අභිප්‍රායන් සාක්ෂාත් කර ගැනීම සඳහා මහජන පුස්තකාලවලට භෞතික සම්පත් පමණක් ප්‍රමාණවත් නොවේ. මෙකී භෞතික සම්පත් ඉහත අභිප්‍රායන් සපුරා ගැනීමට හැකි ලෙස කළමනාකරණය කළ හැකි මානව සම්පතක්ද මෙහිදි අත්‍යවශ්‍ය වේ. එහෙයින් මහජන පුස්තකාල සඳහා කරනු ලබන බඳවාගැනීම්, උසස්වීම්, සේවා පරිසරය සහ සේවා තෘප්තිය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරිම වැදගත්ය. විශේෂයෙන්

කාර්ය මණ්ඩලය සමග බැඳුණු මෙම ක්‍රියාවලිය විධිමත් ආකාරයට සිදුවීම ඉහත අභිප්‍රායන් සපුරා ගැනීමට ප්‍රබල සහායක් වනු ඇත.

ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාල පද්ධතියට පසු වැඩිම ව්‍යාප්තියක් දක්වනුයේ මහජන පුස්තකාල පද්ධතියයි. ඒවා මහනගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා සහ පළාත් පාලන ඒකක යටතේ පාලනය වේ. ශ්‍රී ලංකාව පුරා විහිදී ඇති මහජන පුස්තකාල සංඛ්‍යාව 1100කි.

මෙම අධ්‍යයනයේදී අවධානයට යොමුකර ඇත්තේ ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ මහජන පුස්තකාල කාර්ය මණ්ඩලවල තත්ත්වයන් සහ වෘත්තිය ගැටලු සාකච්ඡා කිරීමටත් ඉහත ඇතිවූ මහජන පුස්තකාල අභිප්‍රායන් සාක්ෂාත් කර ගැනීමට එකී තත්ත්වයන් සහ ගැටලු බලපාන ආකාරයන් කෙරෙහිය.

**අධ්‍යයනයේ අරමුණු**

01. උතුරු මැද පළාතේ මහජන පුස්තකාලවල මූලික තොරතුරු පිළිබඳ දළ විග්‍රහයක් කිරීම
02. මහජන පුස්තකාලවල තනතුරු විවිධත්වය විශ්ලේෂණය කිරීම
03. එම තනතුරුවලට අදාළ රාජකාරිමය ස්වභාවය විමසීම
04. තනතුරු හා සම්බන්ධ වෘත්තිය ගැටලු පරීක්ෂා කිරීම

**ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය සඳහා ප්‍රධාන වශයෙන්ම භාවිත කරන ලද්දේ සමීක්ෂණ ක්‍රමවේදයයි. අදාළ නියැදිය භාවිත කරමින් විශාල සංගහනයක් සඳහා නිගමන සාධාරණීයකරණය කළ හැකි පර්යේෂණ ක්‍රමය මෙය බැවින් එය මෙහි පර්යේෂණ ක්‍රමවේදය ලෙස යොදා ගෙන ඇත. එමෙන්ම එය අදාළ ගැටලුව පිළිබඳ විද්‍යාත්මක සහ ක්‍රමවත්ව කරුණු විශ්ලේෂණය කළ හැකි ක්‍රමයකි (Kothari, 1998). ඒ අනුව මෙහි සමස්ත සංගහනය ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාලවල සේවයේ නියුතු කාර්යය මණ්ඩල වන අතර අධ්‍යයන ජනගහනය උතුරු මැද පළාතේ මහජන පුස්තකාලවල කාර්යය මණ්ඩලය වේ. මෙහි නියැදිය ලෙස තෝරා ගන්නා ලද්දේ 2014.06.30 දින ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් කලාවැව මිරිදිය ධීවර පුහුණු අභ්‍යාස ආයතනයේදී පවත්වන ලද පුස්තකාල කළමනාකරණය පිළිබඳ වැඩමුළුවට සහභාගි වූ කාර්ය මණ්ඩල සාමාජිකයින්ය. උතුරු මැද පළාතේ ලියාපදිංචි වී ඇති මහජන පුස්තකාල සංඛ්‍යාව 53 කි. ඒ අතරින් ප්‍රධාන පුස්තකාල 22ක් සහ ශාඛා පුස්තකාල 10ක් (32) නියෝජනය කරමින් වැඩමුළුවට විවිධ තනතුරුවලට

අයත් කාර්ය මණ්ඩල සමාජිකයින් 47 ක් සහභාගි වූහ. මොවුන්ගෙන් 27ක් අනුරාධපුර දිස්ත්‍රික්කයට ද 20ක් පොළොන්නරු දිස්ත්‍රික්කයටද අයත් විය. ප්‍රශ්නාවලී සහ කණ්ඩායම් නාභිගත සම්මුඛ සාකච්ඡා (Focus group interview) මගින් දත්ත රැස්කරන ලදී. ප්‍රශ්නාවලිය වැඩමුළුව අතරතුර දී නියැදියට ලබා දී සම්පූර්ණ කර ගන්නා ලද අතර ඔවුන්ගේ ප්‍රතිචාර වඩාත් පැහැදිලි කර ගැනීම සඳහා දිස්ත්‍රික්ක දෙකට වෙන් වශයෙන් කණ්ඩායම් නාභිගත සම්මුඛ සාකච්ඡා 2ක් පැවැත්විය. සංඛ්‍යාත්මක වගු ඇසුරින් එකී දත්ත විශ්ලේෂණය කෙරිණි.

**දත්ත විශ්ලේෂණය**

වැඩමුළුව නියෝජනය කළ පළාත් පාලන ආයතන පහත දැක්වේ.

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

| ප්‍රධාන පුස්තකාලය | ශාඛා | නියෝජනය |
|---|---|---|
| කහටගස්දිගිලිය ප්‍රාදේශිය සභාව | | 03 |
| රඹෑව ප්‍රාදේශිය සභාව | | 02 |
| කැකිරාව ප්‍රාදේශිය සභාව | මරදන්කඩවල | 01 |
| | මඩාටුගම | 01 |
| | පලුගස්වැව | 01 |
| කැබිතිගොල්ලෑව ප්‍රාදේශිය සභාව | | 01 |
| මැදවච්චිය ප්‍රාදේශිය සභාව | | 02 |
| ඇලයාපත්තුව ප්‍රාදේශිය සභාව | | 02 |
| නොච්චියාගම ප්‍රාදේශිය සභාව | | 02 |
| රාජාංගනය ප්‍රාදේශිය සභාව | | 02 |
| ඉපලෝගම ප්‍රාදේශිය සභාව | | 02 |
| මිහින්තලේ ප්‍රාදේශිය සභාව | | 01 |
| පදවිය ප්‍රාදේශිය සභාව | | 01 |
| ගලෙන්බිදුණුවැව ප්‍රාදේශිය සභාව | | 02 |
| තලාව ප්‍රාදේශිය සභාව | එප්පාවල | 02 |
| ගල්නෑව ප්‍රාදේශිය සභාව | හුරියන්ගස්වැව | 01 |
| | නෑගම්පහ | 01 |
| **එකතුව** | | **27** |

පොළොන්නරුව දිස්ත්‍රික්කය

| ප්‍රධාන පුස්තකාලය | ශාඛා | නියෝජනය |
|---|---|---|
| හිඟුරක්ගොඩ ප්‍රාදේශිය සභාව | ජයසෙන්පුර | 03 |
| | මින්නේරිය | 02 |
| ලංකාපුර ප්‍රාදේශිය සභාව | | 02 |
| පලාගල ප්‍රාදේශිය සභාව | | 02 |
| වැලිකන්ද ප්‍රාදේශිය සභාව | | 01 |
| දිඹුලාගල ප්‍රාදේශිය සභාව | | 02 |
| ඇළහැර ප්‍රාදේශිය සභාව | | 02 |
| තමන්කඩුව ප්‍රාදේශිය සභාව | | 02 |
| මැදිරිගිරිය ප්‍රාදේශිය සභාව | විජයපුර | 02 |
| | දියසෙන්පුර | 02 |
| **එකතුව** | | **20** |

ඉහත වගුව අනුව උතුරු මැද පළාතේ පළාත් පාලන ආයතනවලට අයත් ප්‍රධාන මහජන පුස්තකාල 22 ක්ද, ශාඛා පුස්තකාල 10ක්ද මෙම නියැදිය තුළින් නියෝජනය වී ඇත.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විවිධ ප්‍රමිතීන් අනුගමනය කරමින් ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ශ්‍රේණිගත කිරිම් කරනු ලබයි. නියැදියට අදාළ පුස්තකාලවල ශ්‍රේණිගත කිරිම් පහත පරිදි වේ.

| දිස්ත්‍රික්කය | අධිශ්‍රේණිය | I ශ්‍රේණිය | II ශ්‍රේණිය | III ශ්‍රේණිය | ශ්‍රේණිගත කර නොමැති | එකතුව |
|---|---|---|---|---|---|---|
| අනුරාධපුරය | - | - | 05 | 10 | 05 | 20 |
| පොළොන්නරුව | - | - | 02 | 04 | 06 | 12 |
| එකතුව | - | - | 07 | 14 | 11 | 32 |

1 වගුව : නියැදියට අදාළ පුස්තකාල ශ්‍රේණිගත කිරිම

ඉහත වගුවෙන් පැහැදිලි වන්නේ උතුරු මැද පළාතේ කිසිදු මහජන පුස්තකාලයක් අධි හෝ I ශ්‍රේණියට ළගා වී නොමැති බවය. (අනුරාධපුර මහ නගර සභා පුස්තකාලයේ කිසිවකු වැඩමුළුවට සහභාගි නොවූ බැවින් අධ්‍යයනයට එය අදාළ කර නොමැත)

මෙහිදි පුස්තකාල එකතුව සහ සක්‍රීය පාඨක සංඛ්‍යාව පිළිබඳ දළ විමසා බැලීමක් කරන ලදී. ඒ අනුව නියැදියේ පුස්තකාලවල එකතුව පිළිබඳ විස්තර 2 වගුවේ දැක්වේ.

| **එකතුන් පරාසය** | **අනුරාධපුර දිස්ත්‍රික්කය** | **පොළොන්නරු දිස්ත්‍රික්කය** | **එකතුව** |
|---|---|---|---|
| 1000 ට අඩු | 1 | 2 | **3** |
| 1000 - 2000 | 1 | 2 | **3** |
| 2001- 3000 | 4 | 2 | **6** |
| 3001 - 5000 | 1 | 5 | **6** |
| 5001 - 10000 | 10 | 2 | **12** |
| 10000 ට වැඩි | 5 | 1 | **6** |

**2 වගුව : පුස්තකාල එකතුව**

මෙයින් පෙනී යන්නේ වැඩිම පුස්තකාල සංඛ්‍යාවක (12) එකතුව 5001 - 10000 පරාසයට අයත්වන බවය. 1000 ට අඩු එකතුවක් සහිත පුස්තකාල තුනක්ද (03) 10000 ට වැඩි එකතුවක් සහිත පුස්තකාල හයක් (06) ද උතුරු මැද පළාතේ තිබේ. 10000 ට වැඩි එකතුවක් සහිත පුස්තකාල හයෙන් පහක්ම තිබෙනුයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේය.

මෙම පුස්තකාල එකතු පරිහරණය කරන පාඨකයින්ගේ සංඛ්‍යාව වෙතද මෙහිදී අවධානය යොමු කෙරිණි. ඒ අනුව උතුරු මැද පළාතේ සක්‍රීය පාඨකයින්ගේ සංඛ්‍යාව 3 වගුවේ දැක්වේ.

| පාඨක සංඛ්‍යාව | අනුරාධපුර දිස්ත්‍රික්කය | පොළොන්නරු දිස්ත්‍රික්කය | එකතුව |
|---|---|---|---|
| 100 ට අඩු | - | 1 | 1 |
| 100 - 200 | 7 | 2 | 9 |
| 201 - 300 | 5 | - | 5 |
| 301 - 400 | - | 1 | 1 |
| 401 - 500 | 1 | 1 | 2 |
| 501 - 600 | 4 | 2 | 6 |
| 601 - 700 | - | - | - |
| 701 - 800 | 1 | 1 | 2 |
| 801 - 900 | 1 | - | 1 |
| 901 - 1000 | 1 | - | 1 |
| 1000 ට වැඩි | 4 | 1 | 5 |

3 වගුව - **සක්‍රීය පාඨක සංඛ්‍යාව**

සක්‍රීය පාඨක සංඛ්‍යාව සලකා බලනවිට පෙනී යන්නේ වැඩිම පුස්තකාල සංඛ්‍යාවක (09) එය 100 - 200 අතර පවතින බවය. 501 - 600 අතර සංඛ්‍යාවක් පුස්තකාල හයක ද 201 - 300 සහ 1000 ට වැඩි සක්‍රීය පාඨක පිරිසක් පුස්තකාල පහකද සිටින බව 3 වගුවෙන් පැහැදිලි වේ.

සෑම ආයතනයකම සාර්ථකත්වයේ කේන්ද්‍රය වනුයේ මානව සම්පතයි. එහෙයින් එම මානව සම්පත විධිමත් ලෙස කළමනාකරණය කිරීම අතිශයින් වැදගත් වේ. මානව සම්පත් කළමනාකරණයේ ප්‍රධාන අරමුණ වනුයේ (i) සංවිධානයේ කාර්යක්ෂමතාව සහ සඵලතාවය (ii) සේවක සුබසාධනය හා තෘප්තිය (iii) සමාජයේ සුබසාධනය යනාදියයි. (උදයංග 2005) මෙහිදී මූලික වශයෙන් තනතුරු නාමය, රාජකාරියේ ස්වභාවය, සේවා ස්ථිරත්වය, උසස්වීම් යනාදිය තිරණාත්මක සාධක වේ.

උතුරු මැද පළාතේ මහජන පුස්තකාලයන්හී සේවයේ නියුතු කාර්ය මණ්ඩලවල තනතුරු නාම පුළුල් පරාසයක විවිධත්වයකින් යුක්ත වන බව පෙනේ. (4 වගුව) පුස්තකාලයාධිපතීන් හැර අනෙකුත් තනතුරුවල මෙම ලක්ෂණය පැහැදිලිව දක්නට පුළුවන.

| තනතුර | අනුරාධපුර දිස්ත්‍රික්කය | පොළොන්නරුව දිස්ත්‍රික්කය | එකතුව |
|---|---|---|---|
| පුස්තකාලයාධිපති I | - | - | - |
| පුස්තකාලයාධිපති II | 1 | - | 1 |
| පුස්තකාලයාධිපති III | 2 | 2 | 4 |
| පුස්තකාල සහායක | 3 | 3 | 6 |
| පුස්තකාල සේවක | 1 | - | 1 |
| පුස්තකාල කම්කරු | 9 | 13 | 22 |
| මාර්ග කම්කරු | 6 | 1 | 7 |
| මුරකරු | - | 1 | 1 |
| කම්කරු | 1 | - | 1 |
| කාර්යාල කම්කරු | 1 | - | 1 |
| නළ ළිං කාර්මික | 1 | - | 1 |
| ආධුනික පුහුණු නිලධාරි | 2 | - | 2 |
| එකතුව | 27 | 20 | 47 |

4 වගුව - තනතුරු නාම

මෙයින් පැහැදිලි වනුයේ මධ්‍යම සහ පහළ ශ්‍රේණිවල කාර්ය මණ්ඩල තනතුරු නාමවල විවිධත්වය බෙහෙවින් පුළුල් බවය. නියැදියේ වැඩි පිරිසක් (22) නියෝජනය වී ඇත්තේ පුස්තකාල කම්කරු යන තනතුරු නාමය සහිත වූවන්ය. තනතුරු නාම විවිධත්වය පොළොන්නරුව දිස්ත්‍රික්කයට වඩා අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉහළ අගයක් (10) ගන්නා බව පෙනේ.

නියැදියට අයත් මධ්‍යම සහ පහළ ශ්‍රේණිවල කාර්ය මණ්ඩල විසින් ආවරණය කරන රාජකාරිවල ස්වභාවය වෙත අවධානය යොමු කිරීම වැදගත්ය. 5 වගුවෙහි ඒ පිළිබඳ තොරතුරු දැක්වේ.

| තනතුර | අනුරාධපුර දිස්ත්‍රික්කය | පොළොන්නරු දිස්ත්‍රික්කය | එකතුව |
|---|---|---|---|
| පුස්තකාල සහායක | 03 | 03 | 06 |
| පුස්තකාල සේවක | 01 | - | 01 |
| පුස්තකාල කම්කරු | 09 | 13 | 22 |
| මාර්ග කම්කරු | 06 | 01 | 07 |
| මුරකරු | - | 01 | 01 |
| කම්කරු | 01 | - | 01 |
| කාර්යාල කම්කරු | 01 | - | 01 |
| නළ ළිං කාර්මික | 01 | - | 01 |
| ආධුනික පුහුණු නිලධාරි | 02 | - | 02 |
| **එකතුව** | **24** | **18** | **42** |

5 වගුව - පුස්තකාලයාධිපති තනතුරේ රාජකාරි ආවරණය කරන මධ්‍යම හා පහළ ශ්‍රේණි තනතුරු දරන්නන්

නියැදිය නියෝජනය කරන මධ්‍යම සහ පහළ ශ්‍රේණි කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ සංඛ්‍යාව 42 කි. එම සංඛ්‍යාවෙන් වැඩි දෙනෙක් පුස්තකාලයාධිපති තනතුරේ රාජකාරි ආවරණය කරන්නන් වේ. එලෙස රාජකාරි ආවරණය කරන්නන්ගෙන් බහුතරයක් (22) පුස්තකාල කම්කරුවෝය.

උතුරු මැද පළාතේ මහජන පුස්තකාලවල සේවයේ නියුතු මධ්‍යම සහ පහළ ශ්‍රේණියේ කාර්ය මණ්ඩලවල තවත් විශේෂ ලක්ෂණයක් වන්නේ ඔවුන්ගෙන් සමහරක් ප්‍රාදේශිය සභාවේ කාර්යාලයේ වෙනත් රාජකාරිවල ද නිරතවීමය. (6 වගුව)

| කාර්යයන් | අනුරාධපුර | පොළොන්නරුව | සංඛ්‍යාව |
|---|---|---|---|
| පුස්තකාල සහ කාර්යාල කටයුතු | 03 | 02 | 05 |
| පුස්තකාල සහ රියදුරු | - | 01 | 01 |
| පුස්තකාල හා කාර්මික | - | 01 | 01 |
| **එකතුව** | **03** | **04** | **07** |

6 වගුව: පුස්තකාල කටයුතු සමග වෙනත් රාජකාරි කරනු ලබන කාර්ය මණ්ඩලය

මහජන පුස්තකාල වැනි විශේෂිත ක්ෂේත්‍රවල කටයුතු කිරිමේදී ඊට අදාළ කාර්යයන් පිළිබඳ වෘත්තීමය පුහුණුවක් ලැබීම අත්‍යාවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල කාර්ය මණ්ඩල පුහුණු කිරිමේ කාර්යය විවිධ ආයතන වලින් සිදුකරනු ලබයි. මෙය කාර්ය මණ්ඩලවල දැනුම, ආකල්ප සහ කුසලතා වැඩි දියුණු කිරිමට හේතුවන අතර ආයතනයේ සඵලතාව හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට බලපාන සාධකයන්ද වේ.

| පුහුණු ආයතනය | අනුරාධපුර දිස්ත්‍රික්කය | පොළොන්නරු දිස්ත්‍රික්කය | එකතුව |
|---|---|---|---|
| ජාතික පුස්තකාලය | 06 | 16 | 22 |
| පළාත් පාලන ආයතනය | 08 | 08 | 16 |
| රජරට විශ්වවිද්‍යාලය | - | 01 | 01 |
| **එකතුව** | **14** | **25** | **39** |

**7 වගුව : කාර්ය මණ්ඩල පුහුණුව**

මෙයින් පෙනි යන්නේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන්වලට බහුතරයක් (22) සහභාගි වී ඇති බවයි. කිසිදු පුහුණුවකට මීට පෙර සහභාගි නොවූ සංඛ්‍යාව අටකි (08). එනම්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ පහක්ද (05) ද පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් තුනක් (03) ද වශයෙනි.

පුස්තකාල හා විඥාපන විද්‍යාව වැනි වෘත්තීමය ක්ෂේත්‍රයක සේවය කිරිමේදී ඊට අදාළ වෘත්තීමය දැනුම සහ කුසලතා අත්පත් කර ගැනීම අතිශයින් වැදගත් වේ. නියැදියේ පුස්තකාලයාධිපතින් පස්දෙනාම (5) අදාළ වෘත්තීමය සුදුසුකම් සපුරා ඇත. එහෙත් මධ්‍යම සහ පහළ ශ්‍රේණිවල තත්ත්වය මීට වෙනස්ය. මේ අනුව පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමාවේ පළමු වසර පරීක්ෂණය සමත් හය (6) දෙනෙක් ද (පුස්තකාල සහායක - 2 පුස්තකාල කම්කරු - 2 සහ කම්කරු - 2) අන්තර් මධ්‍ය පරික්ෂණය සමත් දෙදෙනෙක් (02) ද (පුස්තකාල සහායක 01 සහ පුස්තකාල කම්කරු - 01) මධ්‍යම සහ පහළ ශ්‍රේණිවල කටයුතු කරනු ලබති.

සෑම ආයතනයකම කටයුතු කිරිමේදී වෘත්තීයමය සහ පරිපාලන ගැටලු පැන නැගීම සිදුවේ. මහජන පුස්තකාල සම්බන්ධයෙන් මෙකී ගැටලු පළාත් පාලන ආයතනය අනුව වෙනස්විය හැකි වුවද ඒවා ප්‍රමුඛතාවය අනුව පෙළගැස්වීම කළ හැකිය.

| ගැටලුව | තරා අනුපිළිවෙළ |
|---|---|
| දීර්ඝ කාලයක් පුරා තනතුරෙහි ස්ථිර නොකිරීම | 15 |
| අවශ්‍ය සුදුසුකම් සපුරා තිබුණද උසස්වීම් ලබානොදීම | 05 |
| පුස්තකාලයේ කටයුතුවලට අමතරව වෙනත් කාර්යයන්හි යෙදවීම | 03 |
| එක් අයෙකු පමණක් සිටීම නිසා නිවාඩු ලබාගත නොහැකිවීම | 03 |
| පුස්තකාලයාධිපති තනතුරේ රාජකාරි ආවරණය කළද දීමනාවක් නොගෙවීම | 02 |

8 වගුව - වෘත්තීය ගැටලු

මේ අනුව උතුරු මැද පළාතේ පුස්තකාල කාර්ය මණ්ඩලවල මුහුණදෙන ප්‍රමුඛතම ගැටලුව ලෙස දීර්ඝ කාලයක් සේවයේ නියැළුණ ද සේවය ස්ථිර නොකිරීම බව පැහැදිලිවේ. අවශ්‍ය සුදුසුකම් සපුරා තිබුණද නියමිත පරිදි උසස්වීම් නොලැබීම දෙවන ප්‍රමුඛතාව අත්කර ගනී.

## සමාලෝචනය

මහජන පුස්තකාලයක අභිප්‍රාය මිනිසා සමාජීය සහ සංස්කෘතික ලෙස සංවර්ධනය කිරීමට සහායවීම වන හෙයින් එකී කාර්ය සාක්ෂාත් කර ගැනීමට මහජන පුස්තකාලවල කාර්යමණ්ඩලවල භූමිකාවට ප්‍රමුඛස්ථානයක් හිමිවන බව අවිවාදිත කරුණකි. එහෙත් උතුරු මැද පළාතේ තත්ත්වය සලකා බැලීමේදී පෙනී යන්නේ මෙකී අභිප්‍රායන් ඉටුකර ගැනීම සඳහා කාර්ය මණ්ඩලයේ වැදගත්කම කෙරෙහි එතරම් අවධානයක් යොමුකර නොමැති බවයි. විශේෂයෙන් මධ්‍යම සහ පහළ ශ්‍රේණිවල තනතුරු නාමයන්හි පවතින අවිධිමත් බව, ඔවුනට නිශ්චිත රාජකාරියක් නොවීම, උසස්වීම් පරිපාටි විධිමත් ලෙස ක්‍රියාත්මක නොවීම යනාදිය මගින් මේ බව මනාව තහවුරු වේ.

පුස්තකාලයාධිපති තනතුරු විශාල සංඛ්‍යාවක් පුරප්පාඩු වී පැවතිය ද ඒවා සඳහා සුදුස්සන් පත්කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් මධ්‍යම සහ පහළ ශ්‍රේණිවල කටයුතු කරන කාර්ය මණ්ඩල සාමාජිකයින් රැසකට පුස්තකාලයාධිපති තනතුරෙහි රාජකාරි ආවරණය කිරීමට සිදුව ඇත.

මෙම අවිධිමත් පත්වීම්වලින් අනියම් ලෙස පෙනීයන කරුණක් වන්නේ මහජන පුස්තකාල පිළිබඳ දේශපාලන සහ පරිපාලන බලධාරීන්ගේ පටු ආකල්පයයි. මහජන පුස්තකාලයේ කාර්යයන් ඕනෑම මට්ටමක අයෙකුට (නළ ළිං, කාර්මික, රියදුරු) කළ හැකි බව ඔවුන් නිගමනය කර ඇති බව එයින් තහවුරු වේ. එහෙත් යුනෙස්කෝ මහජන පුස්තකාල ප්‍රඥප්තියෙන් මහජන පුස්තකාල සේවාව පිළිබඳ ඉෆ්ලා (IFLA/UNESCO) නියමුවන් මගින් දක්වා ඇති මහජන පුස්තකාලයේ අභිප්‍රායයන් සපුරා ගැනීමට එය

ප්‍රබල බාධකයකි. මන්ද, පුරවැසියාගේ සමාජ සහ සංස්කෘතික ජීවිතයේ ධනාත්මක වෙනසක් සිදුකිරීම සරල කර්තව්‍යයක් නොවන හෙයිනි. උතුරු මැද පළාතේ මහජන පුස්තකාල විශාල සංඛ්‍යාවක් (10) ශ්‍රේණිගත කර නොතිබීමත් අනෙක් පුස්තකාලවලින් බහුතරය iii ශ්‍රේණියට අයත්වීමත් මගින් ඒ බව සනාථ වේ.

උතුරු මැද පළාතේ මහජන පුස්තකාලවල මානව සම්පත් කළමනාකරණයේ දැකිය හැකි තවත් ලක්ෂණයක් වනනේ මෙකී අවිධිමත් තනතුරු නාම, රාජකාරි සහ පත්වීම් විධිමත් ප්‍රවාහයකට ඇතුළත් කිරිමට උත්සහ නොකිරිමය. මේ නිසාම දීර්ඝ කාලයක් තිස්සේ අස්ථිර පදනමක් මත රැකියාවේ නියැළීමට බොහෝ දෙනෙකුට සිදුව ඇත. අස්ථිර තත්ත්වය යටතේ දීර්ඝ කාලයක් රැකියාවක නිරතවීම සෘජුවම සේවා කාර්යක්ෂමතාව සහ සඵලතාවට මෙන්ම සේවා තෘප්තියටද නිශේධනාත්මකව බලපායි.

මහජන පුස්තකාල යනු විශේෂිත විෂය ක්ෂේත්‍රයක් හෙයින් ඒවායේ සේවයේ නියුතු වුවන් හට එම ක්ෂේත්‍රය පිළිබඳ නවතම දැනුමක් පැවතීම අත්‍යාවශ්‍ය සාධකයක් වේ. මෙම නව දැනුම සහ කුසලතා ලබා ගත හැකි මාර්ගයක් වන්නේ වෘත්තීය පාඨමාලා හැදෑරීම හෝ පුහුණු වැඩමුළුවලට සහභාගි වීමය. එවිට එමගින් ලබාගන්නා දැනුම හා කුසලතා තම සේවා ස්ථානයේ කාර්යක්ෂමතාව සහ සඵලතාව ඉහළ නංවා ගැනීමට භාවිත කළ හැකිය. එහෙත් මධ්‍යම සහ පහළ ශ්‍රේණිවල සේවයේ නියුතු කාර්ය මණ්ඩලවල සාමාජිකයන් එම පාඨමාලා වෙත යොමු කිරීමේ විධිමත් ක්‍රියාවලියක් ප්‍රාදේශිය සභා තුළ නොපවතී.

උතුරු මැද පළාතේ මහජන පුස්තකාල කාර්ය මණ්ඩල මුහුණ දෙන ගැටලුවලදී ඔවුන් හුදෙකලා වී ඇති බවක් පෙනේ. ඔවුන් සමග කරන ලද සම්මුඛ සාකච්ඡාවේදී මතු වූ ප්‍රධාන කරුණක් වූයේ ස්වකීය කාර්ය මණ්ඩලමය ගැටලු විසදා ගැනීමට පුස්තකාල හා විඥාපන ක්ෂේත්‍රයේ ජාතික ආයතනවලින් ලැබෙන සහයෝගය හා ඔවුන්ගේ මැදිහත්වීම ප්‍රමාණවත් නොවන බවයි. මෙරට පුස්තකාල ක්ෂේත්‍රයේ ප්‍රධානතම උපදේශක ආයතනය ලෙස ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයත් වෘත්තීයවේදීන්ගේ එකමුතුව ලෙස ශ්‍රී ලංකා පුස්තකාල සංගමයත් මීට වඩා මෙම ප්‍රශ්න විසඳා ගැනීමට නිල වශයෙන් මැදිහත් විය යුතු බව ඔවුන් බහුතරයගේ අදහස විය.

මහජන පුස්තකාලයේ සමාජ සහ සංස්කෘතික අභිප්‍රායන් සාක්ෂාත් කර ගැනීමට එහි මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පවත්නා අවිධිමත් බව අවම කර ගැනීම අත්‍යවශ්‍ය වේ.

මෙහිදී විශේෂයෙන් ගැටලු පවත්නා මධ්‍යම සහ පහළ ශ්‍රේණි වෙත සැලකිල්ල යොමුකළ යුතුවේ. එහි පළමු පියවර විය යුත්තේ පුස්තකාල සහායක, පුස්තකාල කම්කරු/සේවක යන තනතුරු හැර අනෙක් තනතුරු නාම පුස්තකාල කාර්ය මණ්ඩලවලින් ඉවත් කිරීමය. එමෙන්ම පුස්තකාල සහායක සහ පුස්තකාල කම්කරු/සේවක තනතුරු සඳහා විධිමත් බඳවා ගැනීම් සහ උසස්වීම් පරිපාටියක් සැකසීමය. එම තනතුරුවල ස්ථිර තත්ත්වයේ නොසිටින අයවලුන් අදාළ වෘත්තීය පාඨමාලා හැදෑරීමට යොමු කිරීමය.

මෙයට අමතරව මහජන පුස්තකාලයක සමාජ සහ සංස්කෘතික අභිප්‍රාය කාර්යක්ෂම සහ සඵලදායි ලෙස සපුරා ගැනීමට සේවා තෘප්තිය සහිත හා සුදුසුකම්ලත් කාර්ය මණ්ඩලයක අවශ්‍යතාව දේශපාලන සහ පරිපාලන බලධාරීන්ට අවධාරණය කිරීම වැදගත්ය. මෙම කාර්යයයේදී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සහ ශ්‍රී ලංකා පුස්තකාල සංගමය වඩාත් සජීවී සහ සක්‍රිය ලෙස මැදිහත්වීම අත්‍යවශ්‍යය. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයත් පළාත් සභා සහ පළාත් පාලන ආයතනත් වෙත මහජන පුස්තකාල සඳහා කරනු ලබන කාර්ය මණ්ඩල බඳවා ගැනීම් හා උසස්වීම් සඳහා නිශ්චිත ක්‍රියා පටිපාටියක් සකස් කිරීමට අදාළ උපදෙස් ලබා දීම ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයට කළ හැකිය. එමෙන්ම එම කාර්ය විධිමත්ව සිදු කෙරෙන්නේ දැයි අධීක්ෂණය කිරීම ද ඔවුන්ගේ වගකීමකි. මහජන පුස්තකාලවල කාර්ය මණ්ඩලවලට අදාළව මෙම අවිධිමත් ස්වභාවය පිළිබඳ ජාතික මට්ටමේ කතිකාවක් ඇති කිරීම ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ වගකීමකි. සිය වෘත්තිය ගැටලුවලදී හුදෙකලා වූ පිරිසක් නොවේය යන හැගීම කාර්ය මණ්ඩල තුළ ජනිත කළ හැක්කේ එවිටය. ඉෆ්ලා මහජන පුස්තකාල සේවා නියමුව පවසන ආකාරයට සමාජයේ ධනාත්මක වෙනසකට උරදිය හැකි ආයතනයක් බවට මහජන පුස්තකාලය පරිවර්තනය කර ගැනීමට මානව සම්පත් විධිමත් ලෙස කළමනාකරණය කිරිම අත්‍යාවශ්‍ය සාධකයක් හෙයින් ඒ කෙරෙහි පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ ජාතික ආයතනවලටත් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙත් පළාත් පාලන ආයතනවල දේශපාලන හා පරිපාලන බලධාරින්ගේත් අවධානය නොපමාව යොමු විය යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථ


- උදයංග, ශ්‍යාමන් (2005), කළමනාකරණය සරලව, 2 සංස්, කර්තෘ, නුගේගොඩ
- IFLA/UNESCO මහජන පුස්තකාල ප්‍රඥප්තිය (2000), ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, කොළඹ
- Koontz, Babara Gubbin and Berlin Saur (eds.) IFLA Public Library Service Guideline (2010), 2nd ed, Christic
- Kothari, C.R.(1998), Research methodology: methods and techniques, Vikas Publishing House, New Delihi.



### උදිත අලහකෝන්



ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ සංස්කාරකවරයා ලෙස කටයුතු කර ඇත. පුස්තකාල හා විඥාපන විද්‍යාව ඇතුළු විෂයයන් රාශියක් පිළිබඳව ග්‍රන්ථ රචනා කර හා පරිවර්තනය කර ඇති ලේඛකයෙකි. කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ සහකාර පුස්තකාලයාධිපතිවරයා ලෙස කටයුතු කරයි.

### ඩබ්ලිව්. එම්. අරවින්ද



බී. ඒ. විශේෂවේදී (ජනසන්නිවේදනය), ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, සහකාර අධ්‍යක්ෂ (අධ්‍යාපන හා පුහුණු අංශය), ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

# Barriers for research as perceived by science and technology academia in an Indian University

**Dr. Mayank Trivedi and**

**Jaydeep Mehta**

**Abstract**

*This study describes and discussed various factors which affect to research output particularly academicians of faculty of Science and technology of the Maharaja Sayajirao University of Baroda. A well design questionnaire has been distributed among the faculty members of science and technology department for the purpose of data collection, result of the research shows that that university is required to look forward for more factors related to Financial, infrastructure, professional and institutional are more perceived factors for barrier to research outputs. Outcome of the survey are helpful to understand kinds of barriers to be considered by the academicians through which some strategies can be determined.*

**Key Words:**

*Research barrier, Academician, Science, Technology, University, Library, India*

## Introduction

